"No recoveries or provision had been made for the sum of Rs. 133, 121 paid by the Corporation for the fuel etc. of the two vehicles and salaries and allowances paid to two drivers released to the Ministry of Industries and Scientific Affairs."

I do not know why you did that. (*Interruption*) They are not observations. Who used them ? The idea is this. The Auditor-General observed, but all what we want to know is, who used them and where are they ?

I think Sir, there are in may of these Corporations where the Ministries have taken over vehicles of Corporations. I think the time has come where we have to surcharge the Secretary for the use of these vehicles. If it is the private sector, they would have stopped their salaries completely immediately they heard a thng like this. I suppose because it is the Government sector we cannot do that. But, I think the Ministry must pay back that money. The Ministry should pay back the money to the Corporation for all cars that had been used by the Ministry.

Then, Sir, every item of that nature with regard to – (*Interruption*) – Yes, obviously. What have you done about these matters ? It looks as if you have not done anything. I will take one item. Sir, without taking a physical, stock they have taken the book values.

Now, Sir, I know two instances. One is about the Mahaweli book values, Rs. 24 million. These are not small matters. Then if you take the Army book values, Rs. 1.4 million.

You should have taken a physical verification of stock. They are not doing it. So, therefore, I think every item that is being stated here can be disputed. I think he should reply item by item pertaining to the comments, Sir. I do not want to speak at length, because every item is here, and I believe the Hon. Minister will have to look into these matters more carefully, especially when it comes to a case of as to what he is going to do with the monies that have been invested and with the monies that have to be brought to this Corporation through the operations of the Auto Trishaw Passenger Services.

පූ. භා. 11. 57

ආනන්ද දසනායක මහතා (කොත්මලේ)
(திரு. ஆனந்த தஸநாயக்க — கொத்மலே)
(Mr. Ananda Dassanayake–Kotmale)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දුම්කොළ සංස්ථාවේ 1982 වර්ෂයේ වාර්තාවේ පරමාර්ථ ගැන මම පළමුවෙන්ම විමසා බලන්න කැමතියි. එහි 2 වන ඡේදයේ 4 වන සහ 5 වන උප වගන්ති මම කියවන්නම් :

" 2. 4 කැලෑවල වැවෙන කුඩුම්බේරිය ලදු ආරක්ෂා කිරීම, සංවර්ධනය කියම සහ උපයෝජනය

2. 5 දුම්කොළ වගා කිරීම හා පදම් කිරීම, නිෂ්පාදනය, ඇඹිරීම, බෙද හැරීම සහ සිගරැට් හැර දුම්කොළ හා දුම්කොළවලින් නිෂ්පාදිත ද්‍රව්‍ය අලෙවි කිරීම සහ අපනයනය කිරීම. "

මෙහිදී මම අවධානය යොමු කරන්න කැමතියි දුම්කොළ වැවෙන ප්‍රදේශවල දුම්කොළ වැවීම සම්බන්ධයෙන් දුම්කොළ සංස්ථාව අරගෙන තිබෙන පියවර මොනවාද කියන එක ගැන. මේ පිළිබඳව ඉතාමත් හොඳට වැඩ කළ කාලයක් තිබුණා. නමුත් මෑතක සිට [illegible]යෙන්ම හඟුරන්කෙත, වලපනේ වැනි ප්‍රදේශවල පස සේදී යාමට පටනගෙන තිබෙනවා. ඒ සම්බන්ධව අරගෙන තිබෙන පියවර මොනවාද ? ලංකාවේ වස්තුව තමයි පස. පළවෙනි වස්තුව වන පස ආරක්ෂා කරන්න ඕනෑ.

රිචඩ් පතිරණ මහතා (අක්මීමන)
(திரு. றிச்சட் பத்திரன — அக்மீமன)
(Mr. Richard Pathirana–Akmeemana)

වලපනේ පස සේදී යාම වැඩියි.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

අප ගමන් කරන විට අපට මෙය හොඳින් පෙනෙන දෙයක්. ඒ සඳහා ගෙවනු ලබන ආධාර මුදල් දීමනා නියමිත දින වකවානුවල ලබාගැනීමට බැරිවීම මෙයට එක හේතුවක් හැටියට පෙන්වන්න පුළුවන්.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Order, please ! The sitting is suspended till 2 p.m.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 2 ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා [එඩ්මන්ඩ් සමරවික්‍රම මහතා] ගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

அதன்படி, அமர்வு பி. ப. 2மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. குழுப் பிரதித் தலைவர் அவர்கள் [திரு. எட்மன் சமரவிக்ரம] தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 2 p.m. and then resumed, MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. EDMUND SAMARAWICKREMA] *in the Chair.*

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ගරු සභාපතිතුමනි, මම කලින් සඳහන් කරමින් සිටියේ දුම්කොළ සංස්ථාව මඟින් නිකුත් කර තිබෙන 1982 වාර්තාවේ සඳහන් වන ඒ සංස්ථාව පිහිටුවීමේ පරමාර්ථ ගැනයි. ඒ වාර්තාවේ 2 : 1 අංකය යටතේ බීඩි ඔතන කොළ ආනයනය, බෙද හැරීම හා අලෙවි කිරීම ගැන කරුණු සඳහන් වෙනවා. ඊවාගේම අංක 2 : 5 යටතේ දුම්කොළ වගා කිරීම, නිෂ්පාදනය, ඇඹිරීම, බෙදහැරීම සහ පදම් කිරීම, සිගරැට් හැර දුම්කොළ අපනයනය හා දුම්කොළ වලින් නිෂ්පාදිත ද්‍රව්‍ය අලෙවි කිරීම සහ අපනයනය කිරීම ගැන කරුණු දැක්වෙනවා.

අපනයනය කිරීම හා අලෙවි කිරීම ගැන පමණක් දුම්කොළ සංස්ථාව හුඟාක් උනන්දු වී තිබෙන බව පෙනෙනවා. ඒ එක්කම දුම්කොළ සංස්ථාවට අවශ්‍ය නොවන වැඩ කටයුතුවලට මුදල් වෙන් කර තිබෙනවා. අපි මේ සම්බන්ධයෙන් කීප විටක්ම කරුණු කියන විට එදා නියෝජ්‍ය ඇමතිතුමා වශයෙන් කටයුතු කළ අද ඇමතිතුමා වශයෙන් කටයුතු කරන මෙතුමාම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තමයි ඇමතිතුමාටත් වඩා ඉහළට ඇවිත් මේ වැඩ හරියට කර තිබෙනවායයි කිව්වේ. අපි එද කිව්වේ මෙයයි. භාණ්ඩාගාරය බොහෝම අමාරුවෙන් මුදල් වෙන් කරනවා. ඒ වෙන් කරන මුදල් සංස්ථාවේ පරමාර්ථ අනුව යොද නැති බව දැන් පැහැදිලි වෙනවා.

අපට වුවමනා කළේ පළමුවෙන් දුම්කොළ වගාව දියුණු කිරීම. විශේෂයෙන්ම මැදරට ප්‍රදේශයේ, හඟුරන්කෙත, වලපනේ, කොත්මලේ කොටසක් ආදි ප්‍රදේශ ඊට අයිති වෙනවා. ඒවාගේම මාතලේ ප්‍රදේශයේත් දුම්කොළ වගා කෙරෙනවා. දුම්කොළ වගා වුණු මේ ප්‍රදේශ අද ඇත්ත වශයෙන්ම වැඩිමනත් වශයෙන් නිසරු බිම් බවට පත්වී තිබෙනවා. දැන් සමහර ප්‍රදේශවල ඉතුරු වී තිබෙන්නේ ගල් බොරලු ටිකත් මුල් පැදුණු ගස් ටිකත් විතරයි. එහි යන ඕනෑම කෙනෙකුට එය දකින්න පුළුවන්. මෙය හරිම අභාග්‍ය සම්පන්න තත්ත්වයක්. දුම්කොළ සංස්ථාවට කරන්න කොතෙකුත් වැඩ තිබියදී කර තිබෙන්නේ වෙනත් දේවල්. අපි කීප වතාවකදීම මේ ගරු සභාවේදී ඒවා ගැන ප්‍රශ්න කළාම, " නෑ, නෑ, දුම්කොළ සංස්ථාව හරියට ක්‍රියා කර තිබෙනවා "යයි කිව්වා. අමාත්‍යාංශයේ වෙනසක් වුණාට පස්සේ දැන් අපට පේනවා මොනවාද කර තිබෙන්නේ කියා ඒ දවස්වල.

දුම්කොළ වගාව සඳහා දුන් මුදල් රුපියල් විසි ලක්ෂයක් " ඉන්ටබෙක්ස් " නමැති ආයතනයකට දී තිබෙනවා. ඒක ජාත්‍යන්තර සම්බන්ධකම් තිබෙන ආයතනයක්. ලංකාවේ දුම්කොළ ටික අඩු මිලට ගෙන වැඩි මිලට වෙනත් රටවලට විකිණීමේ අපනයනය කිරීමේ නිරත වී සිටින ආයතනයක්. එය මේ රටේ පමණක් නොව මැලේසියාවේ පවා සම්බන්ධකම් තිබෙන ආයතනයක්. ඒ විධියේ ආයතනයකට රුපියල් විසි ලක්ෂයක් දුන්නා. අපි එද ඒ කරුණු ඉදිරිපත් කරන විට ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වේ මොනවාද ? " ආ, ඒවා කතා කරන්න එපා. ඒවා මේ විරුද්ධ පක්ෂයේ බොරු. මේ වැඩ කඩාකප්පල් කරන්න විරුද්ධ පක්ෂය කියන බොරු "යයි කිව්වා. නියෝජ්‍ය ඇමතිතුමා හැම වෙලේම නැඟිට නැඟිට කිව්වෙ ඒකයි. අද තමුන්නාන්සේ අහු වී තිබෙනවා මේ ප්‍රශ්නයට. ඒ දවස්වල මේ සංස්ථාවල පාලකයන් කොයි තරම් වැරදි කර තිබෙනවාද කියන එක දැන් තමුන්නාන්සේට පේනවා ඇති.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

එතුමා කැමැත්තෙන්ද මේ අහුවෙලා ඉන්නේ ?

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

කැමති වුණත් අකැමැති වුණත් එතුමාට දැන් කරන්න දෙයක් නැහැ. උගුලේ අහුවුණු සතෙක් වාගේ එතුමා ඉන්නවා.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

ගිරයට අහු වුණ පුවක් ගෙඩියක් වගෙයි.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ඒ නිසා දැන් උත්තර දෙන්න බැරි තත්ත්වයකට එතුමා වැටී සිටිනවා. ඇයි ? ඒ වැරදි කරන්න එද ඉඩ දුන්නා. විරුද්ධ පාර්ශ්වයේ හැම මන්ත්‍රීවරයෙක්ම පාහේ ඒ දවස්වල මේ කටයුතු — විශේෂයෙන්, දුම්කොළ සංස්ථාවේ දූෂණ — ගැන විවේචනය කළා. එතන සිදු වී තිබෙන්නේ ලොකු දූෂණයක්. මුදල් වෙන් කර තිබෙන්නේ ' බජාජ් ' වර්ගයේ ' ත්‍රී - වීලර්ස් ' — පුංචි වාහන ජාතියක් — දුවන්න පමණක් නොවෙයි. [බාධාකිරීම්] ඔව්, ' බජවු ' පාට් දමනවා වගේ වැඩක් තමයි, කර තිබෙන්නේ. 'ත්‍රී - වීලර්ස් ' වගේ දේවල් යෙදවීම සම්බන්ධ වැඩ කරන්න වෙනත් ආයතන නැත්නම් අමාත්‍යාංශ තිබෙනවා. එහෙම නැත්නම් ' Ministry of Transport ' එක තිබෙන්නේ මොකටද ? නමුත් ඒ වැඩේ ' Ministry of Industries ' එක අතට අරගෙන තිබෙනවා. රුපියල් විසි ලක්ෂයක් ' ඉන්ටබෙක්ස් ' නමැති සමාගමකට දී තිබෙනවා. ඒ සමාගම මඟින් වෙනම පෞද්ගලික සමාගමක් — ' S E P ' කියා එකක් — පිහිටුවා තිබෙනවා. [බාධාකිරීම්] ඇයි, එද කීවේ, මේ සමාගම් දෙකේ සම්බන්ධතා තිබෙනවා කියා ? ඒ ' S E P ' එක ස්වයං රැකිරක්ෂා සැපයීමේ ආයතනයක් හැටියට පවත්වාගෙන ගිහින් තිබෙනවා. අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කොට ඒ ආයතනය කොම්පැණියක් වශයෙන් ලියාපදිංචි කර තිබෙනවා. ඒ කොම්පැණියේ කටයුතු සඳහා මුදල් දී තිබෙන්නේ දුම්කොළ සංස්ථාවයි. කාගේ හෝ අනුමතියක් ඇතිවයි, ඒ මුදල් දී තිබෙන්නේ. එතකොට ඒ අනුකතිය කාගේද ? එය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමතියයි. එද තමුන්නාන්සේ කිව්වා, මෙම මුදල ' ලෝන් ' එකක් හැටියට දුන්නාය කියා. " එය එහෙම දී නැතැ " යි කියා මම එද කියන කොට තමුන්නාන්සේ කිව්වා " ලෝන් එකක් හැටියට දුන්නාය " කියලා. මේ වාර්තාව අනුව බලන විට පොරොන්දු පිට, ගිවිසුම් අනුව ; යම්කිසි ආයතනයක මෙම මුදල ආයෝජනය කර තිබෙනවා. නමුත් ' ලෝන් ' එකක් හැටියට නොවෙයි දී තිබෙන්නේ. ණයක් නොවෙයි දී තිබෙන්නේ. එද තමුන්නාන්සේ ප්‍රකාශ කළේ සත්‍ය අදහසක්ය කියා පිළිගන්නවා නම් " මම කිවූ දේ හරිය " කියා තමුන්නාන්සේගේ පිළිතුරු කථාවේදී කියන්න ඕනැ. නැත්නම් "මම කිවූ දේ වැරදිය, වාර්තාවේ තිබෙන දෙය හරිය " කියා කියන්න ඕනැ. තමුන්නාන්සේ කී අදහස් උඩ යම්කිසි පිරිසක් විසින් තමුන්නාන්සේව නොමඟ යවා තිබෙන බව අපිට පැහැදිලි වෙනවා.

දුම්කොළ වගා කරන්නට මේ තරම් මිනිස්සු මුදල් ඉල්ලද්දී, පස් සේදී යාම වළක්වන්නට නොයෙක් විධියේ වැඩ කරන්නට තියෙද්දී, පරීක්ෂණ කර සොයා ගත් බීඩි කොළවලටම සමාන නැත්නම් ඊට වඩා හොඳ කුඩුම්බෙරිය කොළ වගාව දියුණු කරන්නට මුල් යෙදවිය යුතුව තියෙද්දී මොනවාද මේ කරල තියෙන්නේ ? කුඩුම්බෙරිය කියන කොළ වර්ගය ඉන්දියාවෙන් හෝ වෙනත් රටවලින් ගෙන්වන බීඩි කොළවලට වඩා ඉතාම හොඳයි. මට මතක හැටියට විජේරත්න නමැති නිලධාරි මහත්මයෙක් ඒක පළමුවරට සොයාගෙන ඉදිරිපත් කළේ — ඒවා දියුණු කරන්නට තියෙද්දී ' ත්‍රී වීලර් ' අරගෙන ඒවායින් බිස්නස් කරන්නට ගිහිල්ලා දැන් අලි අමාරුවක වැටිලයි ඉන්නේ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman of Committees)

කුඩුම්බෙරිය කියන කොළ ජාතිය කොහේද හැදෙන්නේ ?

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

මහනුවර වැනි කඳුකර ප්‍රදේශවල හැදෙනවා. දුම්කොළ සංස්ථාවේ හිටපු නිලධාරියෙක් ඒවා පරීක්ෂා කර තිබෙනවා. මම හිතන විධියට ඒ දවස්වල මේ කාර්යය අයිතිව තිබුණේ දෙපාර්තමේන්තුවටයි.

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்னாண்டோ)
(Mr. N. Denzil Fernando)

ඒ පරීක්ෂණ කළේ කන්නලේ නේද ?

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

එහෙත් පරීක්ෂණ කළා. වලපනේ ප්‍රදේශයේ කඳු බෑවුම්වල, කොත්මලේ ප්‍රදේශයේ කඳු බෑවුම්වල, හේවාහැට ප්‍රදේශයේ කඳු බෑවුම්වල, හඟුරන්කෙත ප්‍රදේශයේ කඳු බෑවුම්වල, ඒ වාගේම තෙල්දෙණිය යනාදී ප්‍රදේශවල මේ කුඩුම්බෙරිය කොළ වර්ගය හොඳට වැවෙනවා. ඒ ප්‍රදේශවල හොඳට වවන්නට පුළුවන්.

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்னாண்டோ)
(Mr. N. Denzil Fernando)

ඒ දුම්කොළ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

දුම්කොළත් වැවෙනවා. කුඩුම්බෙරිය වගාවත් හුඟක් දුරට ක්‍රියාත්මක කරගෙන ගියා. පසුගිය ආණ්ඩුවෙනුත් ඒ කටයුත්ත ක්‍රියාත්මක කළා. මේ ආණ්ඩුවෙනුත් විකවික කරගෙන ගිහිල්ලා දුම්කොළ සංස්ථාව ඒ කාර්යය භාර ගත්තාට පස්සේ ඒ වගාව එහෙමම අහෝසි වෙගෙන යන තත්ත්වයට පත් කර තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආනන්ද දසනායක මහතා]

මේ වාර්තාවෙන් 'ත්‍රී විලර්ස්' ගැන හොඳ විග්‍රහයක් කර තිබෙනවා. 'ත්‍රී විලර්ස්' මෙපමණ යෙදෙව්වාය, මේ මේ විධියට ඒවා දිවෙව්වාය. මෙපමණ ලාබ තිබුණාය, මෙපමණ පාඩු වුණාය, මෙපමණ ණය ගැතියෝ ඉන්නවාය. මෙපමණ ලක්ෂ ගණනක් ණය අය කර ගන්නට තිබෙනවාය ආදී වශයෙන් එහි විස්තර කර තිබෙනවා. නමුත් ස්වදේශීය නිෂ්පාදනයක් හැටියට කුඩුම්බේරිය වගා කිරීම සම්බන්ධව එම වාර්තාවේ කොතැනකවත් සඳහන් කර නැහැ. කොපමණ අක්කර ගණනක් වගා කළාද, පසුගිය කලයේ කොපමණ වගා කර තිබුණාද, 1982 වර්ෂයේදී මෙම සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙම කටයුත්ත භාර ගත්තාට පස්සේ කොපමණ වගා කර තිබෙනවාද, ඒ සඳහා කොපමණ මුදලක් වෙන් කර තිබෙනවාද ආදී කිසිම දෙයක් මෙහි සඳහන් කර නැහැ.

දෙවන කාරණය, දුම්කොළ වගා කරන්නන්ට මෙයින් දෙන ආධාරය කුමක්ද ? කියන එකයි. වැවූ දුම්කොළ ටික එකතු කිරීම පමණයි කරන්නේ. ඒ අයට ආධාර දෙන්න ඕනෑ. මේ මුදල් ඒ සඳහා යොදවන්නට තිබුණා. එක් කෝටි විසි ලක්ෂයක් දී තිබෙනවා යුද හමුදාවට සහ තවත් අයට. එන කොට මේ මුදල් එක් කෝටි හතළිස් ලක්ෂයක පමණ මුදල දුම්කොළ වවන්නන්ට සහනදයක ක්‍රමයකට ඔවුන්ගේ වගාවන් දියුණු කිරීම සඳහා දුන්නා නම් කොපමණ වැදගත්ද ? ඔවුන් පොහොර සපයා ගන්නට ඕනෑ. ඔවුන් බීජ දුම්කොළ ගන්නට ඕනෑ. ඕනෑ කරන බෙහෙත් වර්ග ගන්න ඕනෑ. පොළවේ පස ආරක්ෂා කිරීම සඳහා ගල් වැටි දමන්න ඕනෑ. කාණු දමන්න ඕනෑ. මේ මුදල්වලින් ඒවා සඳහා යම්කිසි ආධාරයක් දෙන්න තිබුණා. එය තමයි භාණ්ඩාගාරයේ පරමාර්ථයත්, මුදල් ඇමතිතුමාගේ පරමාර්ථයත්, සංස්ථාවකට මුදල් දීමේ පරමාර්ථය එයයි. සංස්ථාවේ පරමාර්ථත් මෙතැන සඳහන් කර තිබෙනවා. නමුත් කර තිබෙන්නේ කිසි වැඩක් නැති, සංස්ථාවට අයත් නොවන දේවල්. ඇයි "ත්‍රීවිලර්ස්" දුවවන්න වුවමනා කළේ ?. කාගේ වුවමනාවකටද මේවා කළේ ? මේවා දුවවන්න මහජනයාට වුවමනා කළාද ? දුම්කොළ සංස්ථාව මගින්ද මහජනයාට එය කරන්න වුවමනා කළේ ? නැහැ, කිසිම කෙනෙකුට වුවමනාවක් තිබුණේ නැහැ මෙය කරන්න. එහෙම නම් මේ සංස්ථාවේ එද සිටි සභාපතිත්, අධ්‍යක්ෂ මණ්ඩලයත්—අධ්‍යක්ෂ මණ්ඩලයේ කවුරු සිටියත් අපට කමක් නැහැ—කර තිබෙන්නේ ලොකු වරදක්. එද, අපේ හිටපු කර්මාන්ත ඇමතිතුමාත්, තමුන්නාන්සේත් දෙන්නම හිටියා. එද නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් හා අද ඇමතිවරයා වශයෙන් තමුන්නාන්සේගේ වගකීම මේක. මෙපමණ මුදලක් වෙන් කර තිබෙනවා. නමුත් වැඩ නැහැ. කොපමණද දුම්කොළ වගාකර තිබෙන ප්‍රමාණය ? තමුන්නාන්සේට කියන්න පුළුවන්ද මෙපමණ දුම්කොළ ප්‍රමාණයක් වගා කර තිබෙනවා කියා. අද අපි පිළිතුරක් බලාපොරොත්තු වෙනවා. 1982 සිට 85 දක්වා මෙපමණයි වගා කර තිබුණේ, 1977 සිට 82 දක්වා මෙපමණයි වගා කර තිබුණේ, ඊට පෙර මෙපමණයි වගා කර තිබුණේ ආදී වශයෙන් පැහැදිලිව කියන්න තමුන්නාන්සේට පුළුවන් වෙන්න ඕනෑ. එහෙම නොහැකි නම් දුම්කොළ සංස්ථාවේ පරමාර්ථවලින් ප්‍රධාන පරමාර්ථය සම්පූර්ණයෙන් අතපසුවෙලා යනවා. එහෙම නම් මේ සංස්ථාව තිබීමෙන් වැඩක් නැහැ.

ඊළඟට බීඩි එතීම සහ බීඩි කොළ ආනයනය කිරීම ගැන බලමු. මේ බීඩි කොළ ගෙන්වීමේදී මුල සිටම 'රැකට්' එකක් තිබෙනවා. අවුරුදු 20 ක් 30 ක් තිස්සේ නොයෙකුත් ආණ්ඩු උත්සාහ කළා මෙය නැති කරන්න. නමුත් හැම ආණ්ඩුවකටම බැරි වුණා මේ තත්ත්වය නැති කරන්න. මෙහි ඒකාධිකාරයක් තිබෙනවා. මෙය කිහිප දෙනෙක් පමණක් අල්ලාගෙන ඉන්නවා. මේ තත්ත්වය නැති කළේ නැත්නම් කවදාවත් සාමාන්‍ය මිනිහාට බීඩි ඔතලා ජීවත් වෙන්න පුළුවන්කමක් ඇති වෙන්නේ නැහැ. ප්‍රධාන පෙළේ ආයතන දෙකක් තුනක් – පුද්ගලයින් දෙන්නෙක් තුන් දෙනෙක් – මෙය සම්පූර්ණයෙන්ම බදාගෙන, වෙලාගෙන, මේ වරප්‍රසාද අනික් අයට නොයන ලෙස කටයුතු කරගෙන තිබෙනවා. මේ තත්ත්වය කවද හරි නැති කරන්න ඕනෑ. එහෙම නොකළොත් ගම්බද ප්‍රදේශවල අයට මෙයින් ප්‍රයෝජනයක් ලබා ගන්න බැරි වෙනවා.

මහනුවර දිසා ඇමතිතුමාත් දැන් මෙහි ඉන්නවා. මට පෙනෙන්නේ නැහැ ගම්පොළ ප්‍රදේශයේ බීඩි ඔතන ස්ථාන එකක් දෙකක්වත් තිබෙනවාය කියා. කොත්මලේ ප්‍රදේශයේ නම් එවැනි ස්ථාන එකක්වත් නැහැ. නාවලපිටිය ප්‍රදේශයෙන් එකක්වත් නැහැ. එහෙම නම් මේවා කොහාටද යන්නේ ? කව්ද මේ කටයුතු කරන්නේ ? සංස්ථාවත් කියන ඒවා එක ප්‍රදේශයකට, එක පළාතකට, එක ටවුමකට පමණක් උරුම වෙනවාද ? ඇයි මේවායේ කටයුතු බෙදී යන්න බැරි ? ඒ කටයුතු නොබෙදී යන්න හේතුව මෙයයි. සංස්ථාවේ සභාපති තනතුරට හෝ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වෙන අය කරන සෙල්ලම තමයි ලොකු මිනිසුන් කිට්ටුවෙන් ආශ්‍රය කරන්න පටන් ගැනීම. එහෙම ආශ්‍රය කරන්න පටන් අරගෙන, ඒ අය කලින් ගත්තා නම් යම් " කෝටා " එකක්, ඒ විධියටම ඒ අයට ඒක දෙන්න පටන් ගන්නවා. සමහර වෙලාවට කිලෝ ග්‍රෑම් ලක්ෂ ගණනින් දෙනවා. එසේ ලක්ෂ ගණනින් ඒ අයට බෙදනවාමයි. ඒ තත්ත්වය වෙනස් වෙන්නේ නැහැ. එවිට අර පුංචි මිනිහාට බීඩි කොළ සපයන පුංචි ආයතන සියල්ලම වැහෙනවා. ඒ ගැන අමාත්‍යාංශය වගකියන්න ඕනෑ. මට මතකයි කොත්මලේ ප්‍රදේශයේ තිබුණා බීඩි ඔතන ස්ථාන දෙක තුනක්. ඒ මගින් විසිපස් දෙනෙක් තිස් දෙනෙක් පමණ යැපුනා. නමුත් ඒ ආයතන වැහිලා ගියා. ඊට හේතුව නම් ප්‍රධාන පෙළේ ලොකු ලොක්කන්ට, ලොකු කොම්පැණිවලට බීඩි කොළ ගෙන්වීමේ ප්‍රධාන කොටස ලැබුණාම අනික් අයට ඒවා ඉතුරු නොවීමයි. මේ ක්‍රමය නවත්වන්නට බැරි වුණොත් දුම්කොළ සංස්ථාවෙන් ප්‍රයෝජනය ගන්නේ දෙන්නෙක් තුන්දෙනෙක් පමණයි. එහෙම නම් ඇමතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත් මේ ගැන නිශ්ශබ්දව සිටින්නේ ඇයි කියා මා චෝදනා කරනවා. පාර්ලිමේන්තුවට වගකියන්නේ තමුන්නාන්සේලා. මහජනයාට වගකියන්නේ තමුන්නාන්සේලා. රට වෙනුවෙන්, ජාතිය වෙනුවෙන්, හැම දෙනාම වෙනුවෙන් දුම්කොළ සංස්ථාවට වෙන්වුණු එක්කෝටි හතළිස් ලක්ෂයක පමණ මුදල එහි පරමාර්ථ සඳහා යොදවන්න තිබුණා. ඊට බාහිරව, ඊට ඉදුරාම වෙනස් වානිජ ක්‍රමයක් වන ගමනාගමන සේවයක් පිහිටුවන්නට මේ මුදල් යෙදෙව්වේ ඇයිදැයි අපට අහන්නට සිදු වී තිබෙනවා.

මිනිසුන්ට හරියට බීඩි කොළ ටික බෙද දුන්නා නම් එයයි වැදගත්. තමුන්නාන්සේට වුණත් ගන්නට තිබුණා. තමුන්නාන්සේගේ ආසනයේ අයත් බලාපොරොත්තු වෙනවා, ඒ මගින් පොඩි රක්ෂාවක් කර ගෙන ජීවත් වන්නට. කෝ එයට අවස්ථාවක් නැහැනේ ? මගේ ආසනයේත් සමහරවිට සියයකට හෝ එකසිය පනහකට — කලින් ඒ රක්ෂාව කරගෙන ජීවත්වූ අයට — ගන්නට තිබුණා. එයත් නැහැ නේ ? ඒ සියල්ලම වසා දමා ප්‍රධාන පෙළේ කීප දෙනෙකු අල්ලා ගෙන දැන් ඒ කටයුත්ත කරනවා. එසේ කර දැන් කියනවා බීඩි එතීම ලක්ෂ ගණනින් අඩුවුණාය කියා. ඇයි අඩු වුණේ ? සමහර අය කරන්නේ බීඩි එතීම නොවෙයි. සමහර අය මෙහාට ගෙන්වන බීඩි කොළ විදේශවලට විකුණනවා. ගෙන්වන අතරමඟදී විකුණනවා. මෙන්න මේකයි මෙහි තිබෙන බැරෑරුම් ප්‍රශ්නය. මෙහාට ගෙන්වනවා යයි කියනවා. එසේ ගෙන්වූ හැටියේම ආපසු යවා ඒ අය කොමිස් එකක් සාක්කුවේ දමා ගන්නවා. සමහර සංස්ථාවල අධිපතීන් කරන්නේ ඒකයි. මෙහිත් එය සිදු වුණා යයි මම කියන්නේ නැහැ. එහෙත් එසේ වන්නට ඉඩ තිබෙනවා. එහෙම වුණාය කියා ආරංචින් තිබෙනවා.

මම තැවතත් මෙන්න මේ ප්‍රශ්නය අහන්න කැමතියි. කොතෙක් දුරට අලුතින් දුම්කොළ වගා කර තිබෙනවාද, දුම්කොළ වගා කරන අයට දෙන සහනාධාර මොනවාද කියන කරුණු ගැන ගරු ඇමතිතුමා අපට විස්තර දෙන්නට ඕනෑ. මේ වාර්තාවට ඒවා ඇතුළත් වන්නට ඕනෑ. එයයි, වැදගත්. එසේ නැතිව වෙළඳ ගණන් ක්‍රම අපට අවශ්‍ය නැහැ. අපට අවශ්‍ය වන්නේ සාමාන්‍ය වැසියාට කර තිබෙන සේවය මොකක්ද කියන එකයි. බීඩි බොන අයටත් එය ඒ තරම් සේවයක් නොවෙයි. බීඩිවලට සමහරු " කැහිකූරු " කියනවා ; සමහරු " ටීබී කූරු " කියනවා. බීඩිය ක්ෂය රෝගය හැදෙන්නට හේතු වන කූරක් යයි කියනවා. ඒ අනුව බීඩි බොන අයට එය සේවයක් නොවෙයි. නමුත් දුම්කොළ වවන අයට කර තිබෙන සේවය මදි. ඒ නිසා මේ වාර්තාව සම්පූර්ණ කරන්නට නම් ඒ කාලයේ මේවා ගැන කටයුතු නොකෙරුණේ ඇයි කියන එක ඇමතිතුමාගේ පිළිතුරේදී පැහැදිලි කරන්නට ඕනෑ.

මේ මුදල් මේ විධියට යෙදෙව්වේ ඇයි ? මුදල් වැඩිවෙලා නම් කමක් නැහැ. මුදල් අඩුයි. බීඩි කොළ බෙදීමේ සිට එතීම දක්වා සාමාන්‍ය මිනිසුන්ට කරන්නට තිබුණු රක්ෂාවල් නැති කර ඒ මුදල් ඉතිරි කර එමෙන්ම දුම්කොළ වවන අයට දෙන්නට තිබුණු සහනාධාරත් වැඩිපුර නොදී මේ සංස්ථාව කටයුතු කර තිබෙනවා. කුඩුම්බේරිය වගාව අත්‍යවශ්‍ය කටයුත්තක්. දේශීය වගාවක් හැටියට එය දියුණු කරන්න පුළුවන්. එවිට ඉන්දියාවෙන් හෝ වෙනත් රටකින් ගෙන්වන්නට ඕනෑ නැහැ, මෙහිම ඒ වගාව දියුණු කරන්නට පුළුවන්. ස්වදේශීය දේ දියුණු කරන්නට කවුරු හෝ අකැමැති වෙනවා නම් ඔහු ස්වදේශිකයෙක් නොවෙයි, විදේශිකයෙක් හෙවත් පරදේශිකයෙක් වන්නට ඕනෑ. පරදේශිකයින් කැමැති නැහැ, ස්වදේශීය දේ දියුණු කරන්නට.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මීට පසුව මේ අවුරුද්දේ හෝ ඉදිරි අවුරුදු කීපය තුළදී යම්කිසි සැලැස්මක් සකස් කර ඒ සැලැස්ම අනුව මේ බීඩි එතීමේ කර්මාන්තය ගම්බදටත් පලල් වී යන අන්දමට කටයුතු කරන හැටියට මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනවා. ගම්බද ජනතාව බලාගෙන සිටිනවා. තමුන්නාන්සේලාගේ ග්‍රාමෝදය මණ්ඩල වැනි සංස්ථා තිබෙනවා. එවැනි නොයෙක් දේවල් ඇති කර තිබෙනවා. ඒවා කොතරම් දුරට දුවයිද මම දන්නේ නැහැ. ඒවාට කරන්නට යම්කිසි කටයුත්තක් නැතිව ඔවුන් බලා සිටිනවා. මේ කාර්යය ඒවාටවත් දිලා පුළුල් වශයෙන් හැම දෙනාටම බෙදී යන විධියට කටයුතු කර යම්කිසි සහනයක් ඇති කරන්නට ඕනෑ. අයවැයෙන් මුදල් වෙන් වන්නේ හැම දෙනාටම ප්‍රයෝජනයක් ඇති වන අන්දමටයි. ඒ නිසා ඒ ගැන කල්පනා කරන හැටියට ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලනවා. ඒ නිසා ගරු ඇමතිතුමාගේ කථාවේදී මේ ගැන පැහැදිලි කිරීමක් කළ යුතුව තිබෙනවා. දුම්කොළ සංස්ථාව කළ වෙළඳාම් ගැන අපට අවශ්‍ය නැහැ. ඒක, පාඩුද ලාභද ආදී වශයෙන් ගණන් මිනුම් බැලීම සඳහා පමණයි. එම නිසා දුම්කොළ කර්මාන්ත සංස්ථාවෙන් කළ වැඩ මොනවාද කියා සොයා බලා එහි වැඩ කටයුතු හරියාකාර සකස් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ශ්‍රී ලංකා දුම්කොළ කර්මාන්ත සංස්ථාවේ 1982 වර්ෂය සඳහා වාර්තාව ඉදිරිපත් කර ඇති මේ අවස්ථාවේදී, එම වාර්තාවේ අඩංගු කරුණු කීපයක් සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කරන්නට මා බලාපොරොත්තු වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙවැනි සංස්ථාවල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ එම සංස්ථාවල කාර්යයන් පිළිබඳව යම්කිසි හැඟීමක්, අවබෝධයක් පාර්ලිමේන්තුවට ලබා ගැනීම සඳහායි. පාර්ලිමේන්තුව මෙම වාර්තා අනුමත කළ යුතුව තිබෙනවා. මෙම වාර්තාව මැනවින් කියවා බැලූ මට මතක් වුණේ හිටපු කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ ඇමතිතුමා ටික කාලයකට පෙර මෙම ගරු සභාවේදී කළ ප්‍රකාශයක්. එතුමා ශ්‍රී ලංකා දුම්කොළ කර්මාන්ත සංස්ථාවේ සභාපතිතුමා ගැන මොනවාද කිව්වේ ? 1985 අප්‍රේල් 9 වනද හැන්සාඩ් වාර්තාවේ එතුමා කළ ප්‍රකාශය පළ වී තිබෙනවා :

සිරිල් මැතිව් මහතා (කැලණිය)

" . . . . . . එතුමා පත් කළේ මමයි. එතුමා මගේ ආසනයේ ගුරුවරයකු නිසයි පත් කළේ. නමුත් එතුමාට ඥානයක් තිබුණේ නැහැ, දුම්කොළ සංස්ථාව මෙහෙය වන්නට."

මෙසේ සඳහන් කර තිබෙන්නේ දුම්කොළ කර්මාන්ත සංස්ථාවේ සභාපතිතුමා ගැනයි. එතුමාට තමන් පත් කළ බවත්, තමන්ගේ ආසනයේ ගුරුවරයකු නිසා පත් කළ බවත්, නමුත් දුම්කොළ කර්මාන්ත සංස්ථාව මෙහෙය වන්නට එතුමාට ඥානයක් නොතිබුණු බවත් හිටපු කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ ඇමතිතුමා මේ ගරු සභාවේදී කිව්වා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්තවශයෙන්ම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති මෙම වාර්ෂික වාර්තාව කියවා බැලුවාම ඒ කථාවේ ඇති සත්‍යතාව මැනවින් ඔප්පු වෙනවා. මෙම වාර්තාවේ, දුම්කොළ කර්මාන්ත සංස්ථාවේ එක් එක් අංශවල ක්‍රියා සම්බන්ධයෙන්, විගණකාධිපතිතුමාගේ නොයෙක් සටහන් ඇතුළත් කර තිබෙනවා. මට හිතන්නට බැහැ, විගණකාධිපති කාර්යාලය මෙම වාර්තාව ගැන කිසිසේත් සතුටට පත් වුණාය කියා. මන්ද ? මෙහි තබා ඇති නොයෙක් සටහන් දිහා බැලුවාම ඒ බව මැනවින් ඔප්පු වෙනවා. මම උදහරණ කීපයක්ම පෙන්වා දෙන්නම්. සිංහලෙන් මුද්‍රණය කර ඇති වාර්තාවේ 8 වන පිටුවේ පෙන්වා දී තිබෙනවා, විගණනයේදී මතු වුණු නොයෙකුත් අඩුපාඩුකම් පිළිබඳව. එහි මෙන්න මේ ආකාරයට සටහන් කර තිබෙනවා :

" වර්ෂය සඳහා වූ තොග ඌණතාවයන් සහ අතිරික්තයන් ගිණුම්වල වෙන් වෙන්ව පෙන්වා නැත. "

රක්ෂණ ඉල්ලීම් සම්බන්ධයෙන් මෙසේ සඳහන් කර තිබෙනවා :

" මෝටර් රථ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ඉල්ලුම් කර තිබූ රු. 88,451 වූ මුදල ගිණුම් ගත කර නොතිබුණි. "

මේ විධියට විගණනයේදී හෙළිවුණු අඩුපාඩුකම් 8 පිටුවේ පළ කර තිබෙනවා.

මෙම වාර්තාවේ 9 පිටුවේ " ස්ථාවර තැන්පතු පොළිය " ගැන මෙසේ සටහන් කර තිබෙනවා.

" වටිනාකම රු.10,00,000. රු. දශලක්ෂ 7.2 ක ස්ථාවර තැන්පතු සඳහා තථ්‍ය පොළිය රු. 11,16,000 ක් වුවද, එය රු. 10,00,000 ක් ලෙසට ගිණුම් තුළ ප්‍රතිපාදනය කර තිබුණි. "

මෙන්න මේ විධියට දිගටම විගණන වාර්තාවේ පෙන්නුම් කරන්නේ, දුම්කොළ කර්මාන්ත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කර තිබුණු වාර්තාවේ, විගණන සටහන් වලින් පෙන්නුම් කර තිබෙන්නේ, එම සංස්ථාවේ කටයුතුවල නොයෙක් අඩුපාඩුකම්.

ඊළඟට, 10 වන පිටුවේ සඳහන් කර ඇත්තේ මොනවාදැයි බලන්න.

" පහත සඳහන් හේතූන් නිසා, ශේෂ පත්‍රයේ දැක්වෙන ණය ගැතියන්ගේ අගයෙහි නිරවද්‍යතාවය පිළිබඳ මතයක් ප්‍රකාශ කළ නොහැකිය.

i. මතභේදයට ලක්ව ඇති ප්‍රමාණය රු. 2,28,40,000 ක් විය.
ii. රු. 2,87,75,882 ක අගයට දැක්වුණු ණය ගැතියන් අවුරුදු 03 කටත් වැඩි කාලයක් බේරුම් කර නොතිබුණි.
iii. ශේෂ සනාථ කිරීම පිළිබඳ තත්ත්වය අසතුටුදායකය.
iv. රු. 2,70,19,467 ක අගයට දැක්වුණු ණය ගැතියන් පිළිබඳ උප ලේඛන ඉදිරිපත් කර නොතිබුණි.

මේ අන්දමට දුම්කොළ කර්මාන්ත සංස්ථාවේ වාර්තාව, විගණකාධිපතිතුමාගේ කාර්යාලය මගින් බලා, මෙහි සෑම අංශයකම වාගේ අඩුපාඩුකම් දක්වා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දුම්කොළ කර්මාන්ත සංස්ථාවේ අරමුණු ගැන කොත්මලේ මන්ත්‍රීතුමා (ආනන්ද දසනායක මහතා) පැහැදිලි කළා. මෙහි මුදල් යොදවා ඇති ආකාරය එහි අරමුණුවලට විරුද්ධයි. ඇත්තවශයෙන්ම දුම්කොළ සංස්ථාව පිහිටුවීමේ අරමුණු තිබුණා. මේ රටේ, දුම්කොළ කර්මාන්ත සංස්ථාව ඇති කළේ මොකටද ? එහි පරමාර්ථ මොනවාද ? අද දුම්කොළ සංස්ථාවේ මුදල් මොන ආකාරයට යෙදිලද ඒක ක්‍රියාත්මක වෙන්නෙ. කැලණියේ ගරු මන්ත්‍රීතුමාත් (සී. සිරිල් මැතිව් මහතා) ආණ්ඩුවත් අතර තිබෙන පටලැවිල්ලට සම්බන්ධ වෙන්නට අපි කැමති නැහැ. අපට ඒකෙන් වැඩක් නැහැ. නමුත් මෙහි තිබෙනවා මේ සංස්ථාව පටන් ගැනීමේදී තිබුණු අරමුණු මොනවාද කියා. සභාපතිතුමාගේ මේ වාර්තාවේ ඒවා තිබෙනවා. ඒ අරමුණු අනුවද මේ සංස්ථාව ගමන් කරන්නේ කියා අපි අහන්න කැමතියි. මේ විගණන වාර්තාවේ ඒක තිබෙනවා. අරමුණුවලට, ව්‍යවස්ථාවට පටහැනිව ගිය තැන් මේ දුම්කොළ කර්මාන්ත සංස්ථා වාර්තාවේ වෙනම ලකුණු කර තිබෙනවා. එහෙම නම්, අපි තමුන්නාන්සේගෙන් අහන්න කැමතියි, මේ වාර්තාව අනුමත කරන්න මේ පාර්ලිමේන්තුවට — අපට — පුළුවන්ද කියා. මේ වාගේ අඩුපාඩුකම් තිබෙන වාර්තාවක් අනුමත කරන්න පාර්ලිමේන්තුවට පුළුවන්ද ? සෑම පිටුවකම අඩුපාඩුකම් ගැන කියා තිබෙනවා. :

;" 2:5:6:3: ණය හිමි ශේෂයන් :

පහත දැක්වෙන හේතූන් නිසා ශේෂ පත්‍රයේ දැක්වෙන ණය හිමියන්ගේ අගයෙහි නිරවද්‍යතාවය පිළිබඳව මතයක් ප්‍රකාශ කළ නොහැකිය.

i. රුපියල් 11,67,167 ක අගයට දැක්වුණු ණය හිමියන් වර්ෂ තුනකටත් අධික කාලයක් බේරුම් කර නොතිබුණි.
ii. ශේෂ සනාථ කිරීම පිළිබඳ තත්ත්වය සතුටුදායක නොවිය. "

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම වාර්තාවේ 12 වැනි පිටුවේ තිබෙනවා " විගණනය සඳහා සාක්ෂි " කියලා එක ඡේදයක්. එහි තිබෙන්නේ මොකක්ද ?

" ගිණුම් ශේෂ ගණනාවක් පහත දැක්වෙන හේතූන් එකක් හෝ කීපයක් නිසා සතුටුදායක වන පරිදි සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට හෝ විගණනයේ දී නොහැකි විය.

(අ) රු. 1,40,25,104 ක අගය ඇති ස්ථාවර වත්කම් සඳහා සංක්‍ෂේපණ වාර්තා ඉදිරිපත් නොකිරීම.

(ආ) මුදල් පොත අනුව බැංකු ශේෂය රු. 1,10,418 ක් සේ පෙන්වා ඇති නැෂනල් සහ ග්‍රින්ඩ්ලේස් බැංකුවේ අංක 15296 දරන ජංගම ගිණුම වෙනුවෙන් බැංකු සැසඳුම් ඉදිරිපත් නොකිරීම. "

මේ විධියට දිගටම මේ 12 වැනි පිටුවේ සම්පූර්ණයෙන්ම පෙන්වා දී තිබෙනවා විගණනයේදී මේ ගිණුම් භාරගන්නට බැහැ කියා. මේ ඉදිරිපත් කළ ගිණුම් සම්පූර්ණයෙන්ම වැරදි ගිණුම්. විගණන දෙපාර්තමේන්තුව ඒවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රිචඩ් පතිරණ මහතා]

පිළිගෙන නැහැ. රුපියල් කෝටි ගණනක මුදල් තිබෙනවා විගණනයේදී විගණකාධිපති පිළිගත්තේ නැති ඒවා. මෙන්න මේ වාගේ වැරදි තිබෙනවාය කියා සඳහන් වෙනවා.

"(ඊ) රු. 27,98,317 අගය ඇති ඉඩම් සහ ගොඩනැගිලි සඳහා ඔප්පු, ප්‍රධාන ඉන්වෙන්ට්‍රි, රජයේ දෙපාර්තමේන්තු සහ සංස්ථාවලට මාරු කළ වත්කම් සඳහා තක්සේරු වාර්තා, ගොඩනැගිලි පිළිබඳ ලේඛන, ණය අයකර ගැනීමේ ලේඛන, නැත්පත් පිළිබඳ ලේඛන සහ උපලේඛන සහ අනෙකුත් උපයෝගී තොරතුරු නොමැතිවීම.

මොකුත් නැහැ, මේ සංස්ථාවෙ. මේ දුම්කොළ කර්මාන්ත සංස්ථාවෙ වත්කම්, බැරකම් ආදිය පිළිබඳ පොත්පත් නැහැ කියලයි විගණන දෙපාර්තමේන්තුව කියන්නේ. [බාධා කිරීමක්] මෙහි සඳහන් වෙනවා ඒක. අපි තමුන්නාන්සේගෙන් අහන්නෙ තමුන්නාන්සේ අපට ඉදිරිපත් කළ මේ වාර්තාව පිළිගන්න පුළුවන්ද කියන එකයි. මෙහි තිබෙන්නේ මෙය සම්පූර්ණයෙන්ම මුදල් රෙගුලාසිවලට පටහැනිව ගෙන කිය සංස්ථාවක් බවයි. මේ වාර්තාවෙන් ඒක පැහැදිලි කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙහි 16 වැනි පිටුවේ තිබෙන්නේ මොකක්ද ?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Where is thisoffice now ?

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டெனிசில் பெர்னாண்டோ)
(Mr. N. Denzil Fernando)

In Kelaniya.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Sir, we wanted to know from the Hon. Minister where the office of SLTIC is now, he replies that it is in Kelaniya !

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவேகம)
(Mr. Sarath Muttetuwegama)

Where about Kelaniya is it ?

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

It is not safe in Kelaniya. Move it out to Negombo.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙහි සිංහල මුද්‍රණයේ 16 වැනි පිටුවේ මෙසේ තිබෙනවා :

"3 : 12 ණය ගැණුම් :

1982 දෙසැම්බර් මස 31 වන දින වන විට ලංකා බැංකුවෙන් භාර කුවිතාන්සි යටතේ ලබාගත් කොට්කාලීන ණය ප්‍රමාණය රු. 1,11,19,902 ක් විය."

ඇයි ණය ලබාගන්න සිදුවෙලා තිබෙන්නේ ?

මෙවැනි ණය ගැනීමේ අවශ්‍යතාවත් පැන නැගී ඇත්තේ තෝග අධික ලෙස තබා ගැනීම සහ ණය එකතු කර ගැනීමට නොහැකිවීම නිසායි."

රුපියල් කෝටි 11 ක් ණය අරගෙන තිබෙනවා. මොකටද අරගෙන තිබෙන්නේ ? තොග තබාගෙන ඉඳලා. ඒ වාගේම ලැබෙන්න තිබෙන ණය එකතු කරගන්නේ නැතිව ඉඳලා. හිටපු කර්මාන්ත ඇමතිතුමා විසින් මෝඩයෙක් හැටියට සඳහන් කරනු ලැබූ මේ සභාපතිවරයා තවදුරටත් මේ සංස්ථාවේ තබා ගන්නට තමුන්නාන්සේ වැඩ කරනවාද කියා මම වර්තමාන ගරු ඇමතිතුමාගෙන් අහන්නට කැමතියි. හිටපු කර්මාන්ත ඇමතිතුමා—මේ පුද්ගලයා පත් කළ ඇමතිතුමා—මේ උත්තරීතර සභාවට ඇවිදින්, මගේ ආසනයේ ගුරුවරයෙක් නිසයි මම මේ මිනිහාව පත් කළේ, මේ මිනිහාට මොළයක් නැහැයි කිව්වා. හැන්සාඩ් වාර්තාවේ ඒක තිබෙනවා. එම නිසා මේ විගණන වාර්තාව ඉදිරිපත් කළ සභාපති තවදුරටත් දුම්කොළ සංස්ථාවේ සභාපති ධුරයේ තබාගෙනද මේ සංස්ථාව දියුණු කරන්නට යන්නේ කියන එක මම ගරු ඇමතිතුමාගෙන් අහන්නට කැමතියි.

ලංකා බැංකුවෙන් රුපියල් කෝටි 11 ක් ණය අරගෙන තිබෙනවා. තමුන්නාන්සේ වාර්තාව බලන්න. එම වාර්තාවේ සිංහල මුද්‍රණයේ 17 වන පිටුවේ මේ විධියට තිබෙනවා :

"විගණනයේදී දක්නා ලද අඩුපාඩු සංස්ථාවේ අවධානයට යොමු කර ඇත. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ :—

(අ) මූල්‍යමය පාලනය සඳහා කාර්යමය බලතල පැවරීම පිළිබඳ පරිපාටි

(ආ) ස්ථාවර වත්කම් පාලනය

(ඇ) ත්‍රිරෝද රථ ප්‍රවාහන සේවය ක්‍රියාත්මක කිරීම

(ඈ) අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් කිරීම.

(ඉ) සේවක මණ්ඩලය බඳවා ගැනීම් සහ උසස් කිරීමේ පරිපාටි

(ඊ) ණය ගැති සහ ණය හිමි පාලනය

(උ) ගිණුම් ඉදිරිපත් කිරීමේ ක්‍රමය

යනාදී වශයෙන් මෙහි සඳහන් කර තිබෙන අඩුපාඩුකම් අනුව මෙම සංස්ථාව සම්පූර්ණයෙන්ම මුදල් රෙගුලාසිවලට පටහැනිව ගෙන ගිය සංස්ථාවක් හැටියටයි මේ විගණන වාර්තාවෙන් හෙළිවෙන්නේ.

ඒ වාගේම "විගණනය සඳහා සාක්ෂි" යනුවෙන් 24 වන පිටුවේ සඳහන් වෙනවා. එහි සඳහන් වී තිබෙන්නේ මොකක්ද ?

"(අ) විගණනය සඳහා සාක්ෂි

ආරම්භයේ සිට ස්ථාවර වත්කම් සඳහා ලේඛණයක් පවත්වාගෙන නැති බැවින් සංඛ්‍යාක්‍ෂණ වාර්තා ඉදිරිපත් කිරීම අපහසු වී ඇත.

(ආ) නැෂනල් සහ ග්‍රින්ඩ්ලේස් බැංකුවේ ජංගම ගිණුම් අංක 15296, 1976 වර්ෂයේ සිට ක්‍රියාත්මක වී නැත. මෙහි ඇති ශේෂය පිළිබඳව මතභේදයක් ඇත."

බැංකුවේ තිබෙන ගිණුම් ශේෂය ගැන 1976 සිට 1982 වන තුරුම තීරණයකට එන්නට බැරි වී තිබෙනවා.

"(ඇ) සංස්ථාව විසින් අනුගමනය කළ පිළිවෙත වූයේ ශේෂ සම්බන්ධ කිසියම් පක්ෂයක් වෙතොත් සෑම මුදල් වර්ෂ අවසානයකදීම එකී ශේෂයන් කෙළින්ම විගණකයන් වෙත සනාථ කරන ලෙස ඔවුන්ට දන්වා සිටීමයි. අදාළ වර්ෂය තුළදී ද මෙම ක්‍රමය එලෙසින්ම අනුගමනය කර ඇත.

(ඈ) ආරම්භයේ සිටම ස්ථාවර වත්කම් පිළිබඳ ලේඛනයක් නොපැවති බැවින් අයිතමයන්, වටිනාකම් ආදිය ඇතුළත් කොට අලුත් ලේඛනයක් සකස් කිරීම අපහසු වී ඇත.

(ඉ) සමීක්ෂණ මණ්ඩල මගින් තොග සංඛ්‍යාක්‍ෂණයේදී හෙළි වූ ඌණතා, අතිරික්ත ආදිය පිළිබඳව නිසි කටයුතු කර ඇත."

මේ විධියට ඉඩම්, ගොඩනැගිලි, ආදායම් බදු ප්‍රතිපාදන ආදිය සම්බන්ධයෙන් නොයෙක් විධියට නිදහසට කරුණු 24 වන පිටුවේ කියා තිබෙනවා. ඒ සභාපතිතුමා—සමරතුංග මහත්මයා—ඉදිරිපත් කළ කරුණුයි මම දැන් කියෙව්වේ. තමන්ගේ නිදහසට විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ කරුණුයි. ඒ. මොකක්ද එයා කියන්නේ ? ආරම්භයේ ඉඳලාම පොතක් තිබුණේ නැති නිසා මම පොතක් තියා ගන්නෙ නැහැ කියනවා.

තමුන්නාන්සේලාගේ රජය බලයට පත් වන වෙලාවේ සංස්ථා ගැන සඳහන් කර මේවායේ දූෂණ තිබෙනවාය කිව්වා. නාස්තිය තිබෙනවාය කිව්වා. නොයෙක් අඩුපාඩුකම් තිබෙනවාය කිව්වා. බඳවා ගැනීමේ පරිපාටියේ වැරදි තිබෙනවාය කිව්වා. උසස් වීම් දෙන්නේ වැරදි ආකාරයටය කිව්වා. ඒ නිසා මේවා හදන්නට අපට ආණ්ඩුබලය දෙන්න යයි කිව්වා. මේ තමුන්නාන්සේලා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පත් කළ සභාපති කියන්නේ මොකක්ද ? 24 වන පිටුව බලන්න. "අත්සන් කලේ. ඩී. ජේ. සමරතුංග, සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ" එයා මොකක්ද කියන්නේ. විගණකාධිපතිතුමාගේ ලිපියට පිළිතුරු හැටියට එයා දීපු කරුණු. එයාගේ නිදහසට කියපු කරුණු තමයි, මෙහි ඇතුළත් වී තිබෙන්නේ. මුල ඉඳලා පොතක් තිබුණේ නැති නිසා මමත් පොතක් තබා ගත්තේ නැහැ කියලයි එයා කියන්නේ.

"ආරම්භයේ සිට ස්ථාවර වත්කම් සඳහා ලේඛණයක් පවත්වාගෙන නැති බැවින් සංක්‍යාක්‍ෂණ වාර්තා ඉදිරිපත් කිරීම අපහසු වී ඇත."

ඩී. ජේ. සමරතුංග මහතායි මේ කියන්නේ.

"තැණතල් සහ ග්‍රින්ලේස් බැංකුවේ ජංගම ගිණුම් අංක 15296, 1976 වර්ෂයේ සිට ක්‍රියාත්මක වී නැත. මෙහි ඇති ශේෂය පිළිබඳව මතභේදයක් ඇත."

කවුද කියන්නේ ? සභාපති කියන්නේ. 1976 ඉඳලාම 1982 වන තුරුම බැංකුවේ තිබෙන බැලන්ස් එක ගැන—ශේෂය ගැන—තීරණයක් ගන්නට එයාට බැරි වුණා. ඒ වාගේම මෙසේද සඳහන් වෙනවා :

"ආරම්භයේ සිටම ස්ථාවර වත්කම් පිළිබඳ ලේඛනයක් නොපැවති බැවින් අයිතමයක්, වටිනාකම් ආදිය ඇතුළත් කොට අලුත් ලේඛනයක් සකස් කිරීම අපහසු වී ඇත."

මේ ඔක්කොම කියන්නෙ කවිද ? සභාපතිතුමයි කියන්නෙ. විගණන දෙපාර්තමේන්තුවෙන් අසන ලද දේට ඔහු දෙන උත්තරය මොකක්ද ? ඔහු කියන්නෙ මෙයයි :

(අ) ආදයම් බදු සඳහා ප්‍රතිපාදන
ඉල්ලීමක් කර තිබුණේ නම් ආදායම් බදු වගකීම් මුදල සැකසී ඇති ආකාරය පිළිබඳ විස්තර ලබා දීමට හැකිකම තිබුණි."

"ඉල්ලීමක් කර තිබුණේ නම් . . ." කියනවා. විගණනයට ගියාම විගණන නිලධාරීන් මෙය ඉල්ලන්නෙ නැද්ද ? ඉල්ලුවේ නැති නිසා තමයි වාර්තාවට ඇතුළත් කර තිබෙන්නේ. සභාපතිතුමා කියන්නෙ මොකක්ද ?

(අ) "ඉල්ලීමක් කර තිබුණේ නම් ආදයම් බදු වගකීම් මුදල සැකසී ඇති ආකාරය පිළිබඳ විස්තර ලබා දීමට හැකිකම තිබුණි.

(ආ) අදල වර්ෂය සඳහා ආදයම් බදු ගෙවීමට නොතිබුණු බැවින් මේ සඳහා ප්‍රතිපාදන ගිණුම්වල ඇති කිරීම අවශ්‍ය නොවීය."

ඔහු කියන විධියට ඒ වර්ෂයට අදයම් බදු කිසිවක් ගෙවන්න තිබුණේ නැතිලු. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දුම්කොළ කර්මාන්ත සංස්ථාව ඇති කිරීමේ අරමුණුවලින් සම්පූර්ණයෙන්ම බැහැරව මෙම සංස්ථාව කටයුතු කර තිබෙන බවත්, රජයේ මුදල් විශාල වශයෙන් නාස්තිවන ආකාරයට මෙම සංස්ථාව කටයුතු කර තිබෙන බවත් මෙම වාර්ෂික වාර්තාවෙන් හෙළි කර තිබෙනවා. විගණනයෙන් එය පෙන්නා දී තිබෙනවා. අරමුණුවලට පටහැනිව කටයුතු කර තිබෙනවා. ව්‍යවස්ථාවට පටහැනිව කටයුතු කර තිබෙනවා. කිසිම වත්කමක් ගැන කිසිම ලේඛනයක් නැහැ. ආරම්භයේ සිටම ඒ ලේඛන පවත්වාගෙන ගියේ නැත්නම් පසුවවත් ඒවා පවත්වාගෙන යා යුතු බව දැනගන්න ඕනෑ. සභාපතිතුමා කියනවා, ආරම්භයේදී සිටම තිබුණේ නැහැ කියා. මම හිතන විධියට ආරම්භයේ සිටම—1977 සිටම—සභාපති වශයෙන් කටයුතු කර තිබෙන්නෙ මේ සභාපතිතුමාමයි. මම හිතන විධියට 1977 සිටම සමරතුංග මහත්මයා තමයි, සභාපති හැටියට කටයුතු කර තිබෙන්නෙ. 1985 වර්ෂය වන විට අවුරුදු අටක් පමණ කටයුතු කර තිබෙනවා. මෙම වාර්තාව—එතුමාගේ ලිපිය—ඉදිරිපත් කර තිබෙන්නෙ, 1984 දීයි. මෙම වාර්තාවෙන් පැහැදිලි වෙනවා එතුමා කොයි තරම් දක්ෂ පුද්ගලයෙක්ද කියා. එම නිසා මම ගරු කර්මාන්ත ඇමතිතුමාගෙන් එක් ඉල්ලීමක් කරන්න කැමතියි. හිටපු කර්මාන්ත ඇමතිතුමාම—ඒ සභාපතිතුමා එම තනතුරට පත් කළ ඇමතිතුමාම—කියනවා මොහු මෝඩයෙක්ය කියා. එය හැන්සාඩ් වාර්තාවේ සඳහන් වෙනවා, මොහුට මේ සංස්ථාව ගෙන යන්න බැහැ. ඒ නිසා මෙම සංස්ථාව බේරාගන්න ඕනෑ නම් කරුණාකර මේ වගේ පුද්ගලයින් මෙතැනින් අයින් කරන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බීඩි ගැන, සුරුට්ටු ගැන, පයිප්ප දුම්කොළ ගැන මේ සංස්ථාව සලකා බලන්න ඕනෑ. අරමුණුවල හැටියට ඒ කටයුතු කෙරෙන්න ඕනෑ. සිගරට් හැර අනික් සියලු දෙයක්ම සංස්ථාවට අයිතියි. අරමුණු මොනවාද කියා මෙහි සඳහන් වෙනවා. අද බීඩි බොන මිනිහා විඳින දුක ගැන දන්නවාද ? බීඩි නිෂ්පාදනය කරන පුද්ගලයාට ඇතිවී තිබෙන දුක ගැන දන්නවාද ? මෙම සංස්ථාව මගින් ඒ අයට සහන සලසා දෙන්න ඕනෑ. අද බීඩි නිෂ්පාදනයට සිදුවී තිබෙන්නේ මොකක්ද ? කොත්මලේ ගරු මන්ත්‍රීතුමා (ආනන්ද දසනායක මහතා) කිව්වා, එය නතිකර ඒකාධිකාරයක් බවට පත්ව තිබෙනවාය කියා. කලින් එහෙම තිබුණෙ නැහැ. ඒ වගේම බීඩි මිල, සුරුට්ටු මිල, දුම්කොළවල මිල අද වැඩිවී තිබෙන්නෙ කොහොමද ? සමහර මිනිසුන් ඒවා පාවිච්චි නොකළත් පාවිච්චි කරන අය මේ රටේ ඕනෑ තරම් ඉන්නවා. සිගරට්වල මිල වැඩිවෙනවා. මුදල් ඇමතිතුමාගේ සෑම අයවැය ලේඛනයකින්ම වාගේ එහි මිල වැඩි කරනවා. නමුත් අනික් ඒවා වගේ නොවෙයි. බුලත්විටක් කන මිනිහාට දුම්කොළයක් ගන්න පුළුවන්ද ? ඒවායේ මිල ගැන නමුත්නාත්සේලා දන්නවාද ? මේ මුදල් යන්නේ කාටද ? එම නිසා මෙම සංස්ථාව සම්පූර්ණයෙන්ම අසාර්ථක සංස්ථාවක් බවත් වහාම විසුරුවා හැරිය යුතු සංස්ථාවක් බවත් සඳහන් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දුම්කොළ කර්මාන්ත සංස්ථාවේ ඉතිහාසය දෙස බැලූවිට එක්සත් ජාතික පක්ෂයේ ඉතිහාසය හොඳට පෙනෙනවාය කියා මම හිතනවා. අක්මීමන ගරු මන්ත්‍රීතුමා (රිචඩ් පතිරණ මහතා) කිව්වා වාගේ හිටපු කර්මාන්ත ඇමතිතුමා විසින්ම කියා තිබෙනවා දුම්කොළ සංස්ථාවේ සභාපතිතුමා මෝඩයෙක්ය කියා. සංස්ථාවල සභාපතිවරුන් වශයෙන් මෝඩයන් පත් කරනවා. ඒ වාගේම මෙම සංස්ථාව සම්පූර්ණයෙන්ම කටයුතු කර තිබෙන්නේ නීතියෙන් පිටස්තරවයි. කල්පනා කර බලන්න. සංස්ථාවේ අරමුණුවලට අනුව නොවෙයි, කටයුතු කර තිබෙන්නෙ. බජාජ් ගෙන්වීම සංස්ථාවේ අරමුණක් නොවෙයි. ඒ අරමුණු නීත්‍යානුකූලව වෙනස් කරලත් නැහැ. නීතිය ගැන කිසිම සැලකීමක් නැහැ. අනීතියට වැඩ කරනවා. එය තමයි, ධර්මිෂ්ඨ ක්‍රමය.

ඒ වගේම පසුගිය කාලයේදී මේ සංස්ථාවේ නිෂ්පාදනය සම්පූර්ණයෙන්ම අඩුවී තිබෙනවා. බීඩි සම්බන්ධයෙන් බැලුවත් දුම්කොළ සම්බන්ධයෙන් බැලුවත් මොන පැත්තෙන් බැලුවත් මේ සංස්ථාව සම්පූර්ණයෙන්ම අසාර්ථක බව පෙනෙනවා. මේ විධියට මේ සංස්ථාව මොන තරම් වැරදි ක්‍රියා කර තිබෙනවාද යන බව අපට පේන්න තිබෙනවා. හැබැයි මේවා ඔක්කෝම එළිදරවු වුණේ හිටපු ඇමතිතුමා අමාත්‍යාංශයෙන් පිටවුණාට පස්සේ. අනෙක් සංස්ථාවල් මොන තත්ත්වයෙන් අනීතියට වැඩ කර තිබෙනවාද යන වග දැන ගන්න පුළුවන් වන්නේ කවද හෝ යූ. එන්. පී. එක නැති වුණු දටයි. ඒ නිසා මම ගරු ඇමතිතුමාට මේ කාරණය කියන්න කැමතියි. එතුමා බොහෝම අවංක පුද්ගලයෙක්. හැමදම රෑ අට නවයවන තුරු වැඩ කරනවා. සංස්ථා වැටී තිබෙන ප්‍රපාතයෙන් ඒවා ගොඩගන්න එතුමා උත්සාහ කරනවා [බාධාකිරීමක්] පැය හතළිස් අටම වැඩ කරලවත් කරන්න බැරි වැඩක් ඒක.

නීතියට කිසිම ගරු කිරීමක් නැතිව මේ විධියට වැඩ කරන විට සංස්ථාවලට මොනවාද වෙන්නේ ? ඒ නිසා පළමුවෙන්ම මේ වැරදි කළ සභාපතිතුමා අයින්කර දමන්න ඕනෑ බව අපි ගරු ඇමතිතුමාට කියනවා. අඩු ගණනේ මෝඩයෙක් නොවන කෙනෙක් පත් කරන්න ඕනෑ.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

විත්සන්ට් කාරියකරවන පත්කරන්න ඕනෑ.

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

ඊළඟට මේ සංස්ථා ගැන කල්පනා කර බලන්න ඕනෑ. මේ ඉන්ටබෙක්ස් සමාගමට සල්ලි දී තිබෙනවා. මේ ඉන්ටබෙක්ස් සමාගම විශ්වාස කරන්න ටිකක් අමාරු එකක් බව හිටපු ඇමතිතුමාම කියනවා. එතුමා සිටිනතුරු කටකලියාව දමාගෙන මේ ගොල්ලන් අල්ලාගෙන සිටියාලු. දැන් එතුමා එහි නැති වුණාට පසු ඒ ගොල්ලන් ඕනෑම තැනක දුවනවාලු. බලන්න. මේකෙන් පේන්නේ මොකක්ද ? විදේශීය සමාගම් සමග අපි ගිවිසුම් ගහනවා. මේ ගිවිසුම ගැසූ ඉන්ටබෙක්ස් සමාගම විශ්වාස කරන්න බැරි එකක් බව හිටපු ඇමතිතුමාම කියනවා. විරුද්ධ පක්ෂයෙන් අපි මෙපමණ කල් කිව්වෙත් ඔකමනේ ! විදේශීය සමාගම් එක්ක ගිවිසුම් ගහන විට ටිකක් පරෙස්සමෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අනිල් මුණසිංහ මහතා]

එය කළ යුතු බව අපි කිව්වා. දැන් අපට කියනවා, ඉන්ටබෙක්ස් සමාගම සැක සහිත සමාගමක්ය කියා. They have withdrawn all those controls. දැන් සිටින ගරු ඇමතිතුමා සියලුම පාලන නීති රීති අයින්කර දැම්මා. දැන් ඒ අය හරියටම කටකලියාව දත්වලට ගත් අස්සයන් වාගේ දුවන බවයි පෙනෙන්නේ. ඒ නිසා මේ ඉන්ටබෙක්ස් සමාගමට අද මොනවාද වී තිබෙන්නේ ? මේ කියන ඒවා ඇත්තද ? යන ප්‍රශ්න අපි ගරු ඇමතිතුමාගෙන් අහනවා.

ඇත්තවශයෙන්ම අද තිබෙන තත්ත්වය අනුව අපි දන්නවා සිලෝන් ටුබැකෝ කොම්පැණිය ඒකාධිකාරයක් බව. මේ ඒකාධිකාරය කොහොමහරි කඩන්න අපි වැයම් කරන්න ඕනෑ. දැන් බාන් මුදලාලිලා, වවන්නෝ සියලු දෙනාම මේ අයට යටත්. මොකද ? කිසිසේත් තරගකාරීත්වයක් නැති නිසා. තරගකාරීත්වයක් ඇති කලොත් තමයි අපට හොඳක් සෙතක් වන්නේ. එය ඇති කරන්න මොන වැයමක් ගන්නවාද කියා ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමතියි.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

ගරු සභාපතිතුමනි, මම වැඩි වේලාවක් කතා කරන්නේ නැහැ. දුම්කොළ සංස්ථාව ගැන හුඟාක් දේ කතාකර තිබෙනවා. වෙන අවුරුදුවලට වඩා දැන් දුම්කොළ සංස්ථාව ටිකක් වැදගත් ස්ථානයක් ගෙන තිබෙනවා. අලුත් ඇමතිතුමා නිසා වෙන්න ඇති.

මම ගරු ඇමතිතුමාගෙන් ප්‍රශ්න කීපයක් අහන්න කැමතියි. සීමාසහිත " සිටිසන්ස් ස්ටෝර්ස් " නැත්නම් " සිටිසන්ස් සමාගම " දුම්කොළ සංස්ථාවේ " ගංගා " බීඩි, මැද කොළඹ ප්‍රදේශයේ බෙද හරින්නා හැටියට පත්කලා, 1982 විතර. නමුත් මම දන්නා හැටියට 1982 දී ශ්‍රී ලංකා දුම්කොළ සංස්ථාවට ඒ " සිටිසන්ස් ස්ටෝර්ස් " එකෙන් රුපියල් ලක්ෂ 48 ක් පමණ එන්න තිබුණා. [බාධා කිරීම්]

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்னாண்டோ)
(Mr. N. Denzil Fernando)

එද උත්තර දුන්නා.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

නමුත් නැවතත් ගංගා බීඩි බැග්ස් 1,000 ක් පමණ බැංකු සහතිකයක් පිට ඒ සිටිසන්ස් ස්ටෝර්ස් එකට දුන්නා. [බාධා කිරීම්] ඇමතිතුමා මේ ගැන හොඳට දන්නවා ඇති. රුපියල් ලක්ෂ දෙකක මාසික වාරිකයක් ගෙවන පොරොන්දුව පිටයි, එහෙම දුන්නේ. නමුත් මා දන්නා තරමින් දැන් ඒ වාරිකයවත් ගෙවන්නේ නැහැ. [බාධා කිරීම්]

දැන් තමුන්නාන්සේලා ඔක්කෝම කොළේ වහලයි, වැඩ කරන්නේ. දුම්කොළේත් වහලා, පොතේ කොළේත් වහලා.

ඔය " බජාර් බිස්නස් " එකට අයිති ට්‍රයිෂෝස්වලින් තමයි, විරුද්ධ පාර්ශ්වයට ගහන්න, මාදුළුවාවේ සෝභිත හාමුදුරුවන්ට ගහන්න, සරච්චන්ද්‍ර මහත්මයාට ගහන්න බසිකල් චේන් හමුදව ගෙනාවේ. ආණ්ඩු පක්ෂයේ තමුන්නාන්සේලා ඔක්කොම එකතු වෙලා කරපු දේවල් තමයි, ඒවා. ඒ කාලයේ ඒවාට කැබිනට් අනුමැතියත් තිබුණා ; වර්තමාන ඇමතිතුමා නියෝජ්‍ය ඇමතිතුමා වශයෙන් සම්බන්ධ වුණා ; හිටපු ඇමතිතුමාත් සම්බන්ධ වුණා. ඒ විධියට ඔක්කොම එකතු වෙලා ඒ වැඩ කළේ හරියට අලි බබා සහ හොරු හතළිහ වගෙයි. දැන් ඒ පව් බෙද ගන්න බැරුව ජරමරේ. ඒ නිසා ඇමතිතුමා කොළේ වහන්නේ නැතිව කියන්න තිබෙන දේවල් ඔක්කොම කියන්න. ඊට පස්සේ අපි කථා කරමු.

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்னாண்டோ)
(Mr. N. Denzil Fernando)

Sir, I am most thankful to hon. Members of the Opposition for bringing out almost everything that the Auditor-General has mentioned in his Report on the accounts of the Sri Lanka Tobacco Industries Corporation for 1982. I wish to refer to a certain portion in this Report which the hon. Member for Attanagalla (Mr. Lakshman Jayakody) failed to quote. This is what the Auditor-General says at page 6 of the Report :

> **"This activity falls outside the objectives of the Corporation as specified in the incorpration order. Action had not been taken upto December 31, 1983 to amend the incorporation order in terms of Section 3 (2) of the State Industrial Corporations Act, No. 49 of 1957."**

That is what the Auditor-General observes in this Report.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Did you get Cabinet sanction for this ?

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

You only had the sanction of a sub-committee of three members of the Cabinet.

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்னாண்டோ)
(Mr. N. Denzil Fernando)

That will be answered by the Hon. Minister of Finance when he comes.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

You will have to answer because you are the Minister in charge of this subject.

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்னாண்டோ)
(Mr. N. Denzil Fernando)

This has nothing to do with the SEP. We ae now discussing the Annual Report of the Sri Lanka Tobacco Industries Corporation for 1982. Let us take that up at the proper time. Let us not bring that matter into this.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman of Committees)

Order, please ! Let the Hon. Minister reply.

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்னாண்டோ)
(Mr. N. Denzil Fernando)

Let us keep ourselves to the report of the Sri Lanka Tobacco Industries Corporation for 1982.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman of Committees)

Order, please! Hon. Members have already participated in this Debate. Let the Hon. Minister reply.

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்னாண்டோ)
(Mr. N. Denzil Fernando)

(*Interruption*) We are not trying to avoid anything. We will reply to everything. Just because one hon. Member referred to something irrelevant to the subject matter under discussion we are not going to get involved in that. We will reply to those matters at the proper time. But let us now concentrate on this report.(*Interruption*) Let me confine myself to the Report of the Sri Lanka Tobacco Industries Corporation for 1982. That is all I am interested in. Other matters can be taken up in due cosurse. This Corporation was making some profit. There is no doubt about it.

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

The Hon. Minister read out a portion from the Auditor General's report, but he has not commented on that. The Hon. Minister read out a portion from page six of this Report. he must explain that to us.

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்னாண்டோ)
(Mr. N. Denzil Fernando)

The hon. Member is asking me to comment. Let me have my say.

ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා (මහනුවර දිසා ඇමතිතුමා)
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க — கண்டி மாவட்ட அமைச்சர்)
(Mr. W. P. B. Dissanayake–District Minister, Kandy)

He cannot comment on the Auditor-Genral's report. There is no person who is competent to comment on the Auditor-General's report. You cannot do that.

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

I am asking the Hon. Minister to comment on that portion he read out.

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்னாண்டோ)
(Mr. N. Denzil Fernando)

Let me reply. I was listening to you for so many hours.(*Interruption*)

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman of Committees)

Order, Please! Let the Hon. Minister reply.

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்னாண்டோ)
(Mr. N. Denzil Fernando)

The Sri Lanka Tobacco Industries Corporation was making some profits. But in 1981 the government changed its policy and took away their monopoly of importing tobacco leaf and gave it to the private sector. That is government policy. From that time there was a loss. From the profit and loss account for 1982 you will see there is a loss of Rs. 13,983,960. So any body can criticize this Corporation because there is a loss. There is no about that. There is a loss of Rs. 13 million.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

What about your debtors ?

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்னாண்டோ)
(Mr. N. Denzil Fernando)

The loss of Rs. 13 million was because of the change of policy. Under the policy of the previous Government, the monopoly was given to the corporation. Now everybody can do it, the private sector as well as the corporation. Today the corporation is not the only importer of beedi leaf. The private sector and the corporation both import. We do not have a monopoly and several varieties of beedi are being brought into the market. Previously, all the beedi was produced by the corporation and nobody else was allowed to do it. When the corporation had the monopoly, they used to give the leaf to individuals and get the beedies wrapped and they had to bring the beedies back to the corporation and the corporation sold the beedi to the public. Today it is not so. Today, everybody can make and sell beedi.

සරත් මුත්තෙට්ටුවේගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

Do you want people to stop smoking ?

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்னாண்டோ)
(Mr. N. Denzil Fernando)

There is a big gap between these two. There is competition today between the corporation and the private sector.

සරත් මුත්තෙට්ටුවේගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

Are you in favour of smoking ? Are you for smoking or against it ?

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்னாண்டோ)
(Mr. N. Denzil Fernando)

The corporation will not lose everything. We will at least break even. I am taking steps to see that we do not lose public money. I am not sure how far we will

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා]

succeed but we are trying to make a profit I am sure that by the end of the year we will break even. Up to August 1984, the loss has been only Rs. 292,000. We will not lose anything this time. We will see that we break even. I cannot promise a profit but I will see that we will break even. This is public money and we cannot be losing it. It is true we suffered losses earlier but we have taken some remedial measures. We will see that it is done.

The Report can be criticised because of the losses. Hon. Members of the Opposition read the report of the Auditor-General over and over again. It is there. I also saw it. In fact, most of the remedial measures I am taking are based on this report. I am taking those measures.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

What about the Chairman ?

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்ணாண்டோ)
(Mr. N. Denzil Fernando)

A number of unnecessary allegations have been made against the Chairman. He is a very good man and a very efficient man. I will give you 10 days to argue this if you can quote one word from the former Hon. Minister, before he left the Ministry, against the Chairman. After he left the ministry, for some reason or the other –

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

What is the reason ?

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்ணாண்டோ)
(Mr. N. Denzil Fernando)

– for some reason or other – you may not agree with what I say and I may not agree with what you say – the former Minister has fallen out with the Chairman. When such comments are made, it is not that you should take it with a pinch of salt but it should be taken with a ton of salt ! After all, this is a comment made *post mortem.* After the event anybody can sit and say that but this is what happened. If that comment was made when the hon. Member for Kelaniya (Mr. Cyril Mathew) was in his seat as Minister, I would have agreed with the Opposition. This is a comment made much later. For what reason ? I do not want to give the reasons. If I give the reasons, the Opposition might not agree with me and if they state reasons I may not agree with them. Let us not take it seriously. After all, this man is outside this House. If he is given the right to comment, he will come out with facts. This is very unfair. When a man is outside the House, to comment on him, expecially after his being appointed by the former Minister himself is very unfair. I do not want to say anything against anybody, but I must say one thing : that it is very unfair of the hon. Member for Kelaniya, after he had been removed from the office of Minister of Industries, to criticize the appointment made by him. He said that the Chairman was a teacher and a voter of his. It may be so, but during the 7 or 8 year-period he was there, he should have understood what his Chairman was and he could have removed him with a stroke of the pen.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman of Committees)

He will have to come to Parliament to defend himself.

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்ணாண்டோ)
(Mr. N. Denzil Fernando)

If he is given the right, he will. I know him. He told me that he is not at all – I do not want to say that.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

What did he tell you ?

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்ணாண்டோ)
(Mr. N. Denzil Fernando)

I do not want to say it. I meet him very often. He is my Chairman. I accept him as my Chairman. It is not fair for every Member of the Opposition to quote what the former Minister said and go on attacking this poor man, who is outside this House.

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

We were commenting on the illegal work done by your Chairman.

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்ணாண்டோ)
(Mr. N. Denzil Fernando)

Please sit down. I am not giving way.–[*Interruption*]. I listened to you, but I never said anything. Let me have my say. I am in charge of the Ministry. It is not correct. It is true that the former Minister said it. But why should every Member of the Opposition read out what was said by the former Minister about this Chairman ? It is very unfair. How does the Opposition know?

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

Your former Minister told us. That is how we know.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்னாண்டோ)
(Mr. N. Denzil Fernando)

The hon. Leader of the Opposition may have not followed my argument ; therefore I will repeat it. I only said that if the Member for Kelaniya, while being the Minister, said that, the Opposition and myself could have accepted it, but he said it after being removed from the office of Minister of Industries. Therefore, it is not fair. Moreover, this Chairman is involved with the takeover of the SEP because he is the Competent Authority now.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

There you are !

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்னாண்டோ)
(Mr. N. Denzil Fernando)

The Hon. Minister of Finance, on my recommendation, has appointed him as the Competent Authority.–[*Interruption*]. I am not criticizing anyone. I am only saying that members in the Opposition should consider that the statement he made was *post factum.* It is not correct at all to say so after he was removed. After the event is over, anybody can sit in the armchair and say, so and so is bad, but that need not be repeated by others, especially when the Privilege of the House is such that the Chairman has no access to Court. That gentleman is outside the House. Let the hon. Member for Kelaniya challenge him outside. I am sure the Chairman, Mr. D. J. Samaratunge, will take the hon. Member to Court.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அநுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

You can defend him !

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்னாண்டோ)
(Mr. N. Denzil Fernando)

I am completely privileged when I am here–I can say anything here and escape. That is not correct. I too can stand up and say anything. During my 30 to 32 years of politics I have never scolded or criticized anybody personally. In this House I have never done so and I will never do it. I never did that in the Municipal Council and I have never done it in Parliament. I have been personally abused. I can say that, Sir. It was by Dr. N. M. Perera. But later he said, "Denzil, I am really sorry. I only knew later who you were". It is very kind of him to have said that, Sir.

The Auditor-General has given me a very good report. I have taken steps to put the Corporation in a form that we will not suffer a loss of Rs. 13 million. I am hundred per cent sure about that. In 1982, for some reason or other, they have made a loss of about Rs. 13 million. What can I do ?

There was also one question that was raised by the hon. Member for Attanagalla. The question raised was, "What will you do to the debtors". That is really a very serious question. I can assure the hon. Member and every Member of the House that I have already directed the Chairman to try and recover every cent from the debtors and if they find that anyone is not paying up to file action against him. I have said that. That is the last order that I have given. We will try to recover every cent that is due to the Corporation and if there is any money that the Chairman cannot recover from anybody we will file action immediately.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

Citizen watch.

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்னாண்டோ)
(Mr. N. Denzil Fernando)

Against them also.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Who are they ?

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்னாண்டோ)
(Mr. N. Denzil Fernando)

Let it be anybody–X, Y or Z. We have filed action in some cases. So that this report, Sir–[*Interruption*].

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

What is the bet, you will never file action.

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்னாண்டோ)
(Mr. N. Denzil Fernando)

Therefore, let us confine ourselves to the 1982 report and leave the rest.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

Leave the Citizens alone.

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்னாண்டோ)
(Mr. N. Denzil Fernando)

Therefore I say that it is really about the working of the Tobacco Corporation for 1982 and nothing else. As I said earlier, there is a loss. Subject to that, I say that

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා]

this is a report of the real working of the Tobacco Corporation. The Auditor-General's report is there. We have taken remedial measures.

Sir, I would ask the House to accept this Motion.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பெற்று ஏற்றுக் கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය : වාර්ෂික වාර්තාව (1982)

இலங்கை தோல்பொருள் கூட்டுத்தாபனம் : ஆண்டறிக்கை (1982)

CEYLON LEATHER CORPORATION : ANNUAL REPORT (1982)

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்னாண்டோ)
(Mr. N. Denzil Fernando)

I move,

"That in terms of section 30 (2) of the State Industrial Corporation Act, No. 49 of 1957 and section 14 (3) of the Finance Act, No. 38 of 1971, the Annual Report of the Ceylon Leather Products Corporation being report incorporating the Auditor-General's obervations for the year ended 31.12.1982 which was presented on 11.04.1985, be approved."

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ 1982 වාර්ෂික වාර්තාව පිළිබඳව සාකච්ඡා වන මේ අවස්ථාවේදී මා අදහස් කරන්නේ එම සංයුක්ත මණ්ඩලය සම්බන්ධයෙන් කරුණු කීපයක් ගරු ඇමතිතුමාගෙන් විමසා දැනගන්නයි. අපි මේ සාකච්ඡාවට භාජන කරන්නේ 1982 වර්ෂයේ වාර්තාවයි. අද 1985 වර්ෂයයි. එම නිසා මෙම සංයුක්ත මණ්ඩලය පිළිබඳව අද පවතින තත්ත්වය මොකක්ද කියන එකත් ඇමතිතුමාගේ පිළිතුරු කථාවේදී පැහැදිලි කරනවා නම් හොඳයි. මන්ද ? මෙම සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ නිෂ්පාදන ඉතාම අනර්ඝ තත්ත්වයේ නිෂ්පාදන හැටියට ලංකාවේ මහ ජනතාව පරිභෝජනය කළ බව තමුන්නාන්සේ දන්නවා. විශේෂයෙන් ඩී. අයි. සපත්තු. ලෝකයේ ඕනෑම රටක සපත්තුවලට සමාන තත්ත්වයේ සපත්තු එදා මෙම සංයුක්ත මණ්ඩලය විසින් නිෂ්පාදනය කළා. ලංකාවේ විශාල ජන සංඛ්‍යාවක් මේ සපත්තු පාවිච්චි කළා. අදත් පාවිච්චි කරනවා.

1982 වාර්තාවේ සඳහන් කරුණු ගැන කල්පනා කර බලන විට 1980 නිෂ්පාදනයට වඩා 1982 නිෂ්පාදනය අඩුයි. ඒ වාගේම සේවක සංඛ්‍යාව අතින් බැලුවත් 1980 වර්ෂයේ සිටි සේවක සංඛ්‍යාවට වඩා 1982 සේවක සංඛ්‍යාව අඩුයි. ඒ අනුව 1984 වාර්තාව ගත්තොත් තත්ත්වය මොකක්ද කියා අප දැනගන්න කැමතියි. මා විශේෂයෙන් අදහස් කෙළේ ලංකාවේ බාටා සමාගමට දී තිබෙන තැන කුමක්ද කියා ඔබතුමාගෙන් දැනගන්නයි. බාටා සමාගමට මොන විධියේ නිදහසක් දී තිබෙනවාද ? ලංකාවේ සපත්තු නිෂ්පාදන කිරීම සම්බන්ධයෙන්, ලංකාවේ සපත්තු අලෙවිය සම්බන්ධයෙන්, ලංකාවට සපත්තු ගෙන්වීම සම්බන්ධයෙන් අසීමිත නිදහසක් බාටා සමාගමට දී තිබෙනවා. මම තමුන්නාන්සේට මතක් කරන්න කැමතියි, ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ ආරක්ෂාවට බාටා සමාගමට යම් යම් සීමාවන් මීට කලින් දමා තිබුණ බව. තමුන්නාන්සේලා දැන් ඒ සියලුම සීමාවන් ඉවත් කර දමා තිබෙනවා. දැන් ලංකාවට ඕනෑ තරම් සපත්තු ගෙන්වීමට ඒ සමාගමට පුළුවන්. ඕනෑ තරම් සපත්තු ලංකාවේ නිෂ්පාදනය කිරීමට ඒ සමාගමට පුළුවන්. ලංකාවේ ඕනෑම තැනකට ගොස් සපත්තු විකුණන්න ඒ සමාගමට පුළුවන්. සපත්තු පමණක් නොවෙයි මා දන්න විධියට වෙනත් භාණ්ඩ විකුණන්නත් තමුන්නාන්සේලා ඒ සමාගමට අවසර දී තිබෙනවා.

මෙන්න මේ කරුණු නිසා අද ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ නිෂ්පාදනවලට බාටා සපත්තු සමග තරඟ කරන්නට බැරි තත්ත්වයක් ඇති වී තිබෙන බව අපි කනගාටුවෙන් සඳහන් කරන්න ඕනෑ. ඒ වාගේම මේ ගොල්ලන් තවත් වැඩක් කරනවා. මොකක්ද ? සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ නිෂ්පාදනය කරන විධියේ සපත්තු නිෂ්පාදනය කර එම නිෂ්පාදන සංයුක්ත මණ්ඩලයේ මිලට වඩා අඩුවෙන් විකුණනවා. රුපියල් පහක් පමණ අඩුවෙන් විකුණනවා. ඉන් පසුව සංයුක්ත මණ්ඩලයේ ඒ හා සමාන නිෂ්පාදන අත් හිටවුණාට පසුව මිල වැඩි කරනවා. ඔය විධියට සංයුක්ත මණ්ඩලයේ සපත්තු නිෂ්පාදනය නැත්තටම නැති වී යන තත්ත්වයක් ඇති වෙනවා.

සමහර මන්ත්‍රීතුමන්ලාත් ඩී. අයි. සපත්තු පැළඳගෙන එන බව මම දැක තිබෙනවා. ඒ මොකද ? ලෝකයේ ඕනෑම රටක නිෂ්පාදනය වන සපත්තුවලට සමාන සපත්තු ඒ මණ්ඩලයෙන් නිෂ්පාදනය වූ නිසා. නමුත් අද ඒ නිෂ්පාදන තත්ත්වය අනුක්‍රමයෙන් අඩුවේගෙන යනවා. බාටා සමාගමට දුන් අතික් සහන නිසා තමුන්නාන්සේ දන්නවා සිත්වා සපත්තු සමාගමට මොකද වුණේ කියා. ලංකාවේ බොහෝම හොඳ කර්මාන්තයක් හැටියට නැගගෙන ගිය සිත්වා සපත්තු කර්මාන්තායතනයේ අද තත්ත්වය මොකක්ද ? ඒ වාගේම මින්ස් සපත්තු- සමාගමට මොකක්ද වුණේ ? ඊළඟට ඩී.එස්.අයි. සපත්තු සමාගම ගැන බලන්න. එය මගේ ආසනයේ තිබෙන්නෙ. ඩී. සැම්සන් මහත්මයා බොහෝම පුංචි කඩයක එය ආරම්භ කෙළේ. ඉතාමත්ම මහන්සි වෙලා ඉතාම ප්‍රසිද්ධ තත්ත්වයකට ගෙනා ඒ ඩී.එස්.අයි. සපත්තු කර්මාන්තායතනයට අද මුහුණ පාන්නට සිදු වී තිබෙන තත්ත්වය මොකක්ද ? ඊළඟට බෙන්තොට ඉලාස්ටෝ සපත්තු කර්මාන්තයට — ගුණසේකර මහත්වරුන්ගේ සපත්තු කර්මාන්තයට — මොකක්ද වෙලා තිබෙන්නෙ ? බාටා සමාගම ලංකාවෙ කරන වැඩ නිසා ඒවා සියල්ලක්ම අද වහන්න වෙලා තිබෙනවා. මෙහෙම වෙලා තිබෙන්නේ බාටා සමාගමට දීපු නිදහස නිසයි. මීට පෙර මෙහෙම නිදහසක් දී තිබුණේ නැහැ. එම නිසා ඒ කර්මාන්ත ශාලාවල යම්කිසි ප්‍රමාණයකට සම්භාණ්ඩ නිෂ්පාදනය කරලා ඒ අය විකුණා ගත්තා. මේ නිදහස දීමෙන් මොකක්ද වුණේ ? මේ නිසා ඇතිවන තත්ත්වය කුමක්ද ? මේ බාටා සමාගම ලෝකයේ රටවල් ගණනාවකට තමන්ගේ ශාඛා සමාගම් පවත්වාගෙන යන සමාගමක්. අපේ රටේ සපත්තු නිෂ්පාදනය නොකර ඒ අය පිටරටින් සපත්තු ගෙන්වන නිසයි අපේ රටේ ඒ කර්මාන්තයේ යෙදී සිටින සේවකයන් දහස් ගණනකට රක්ෂාවල් නැතිවෙලා තිබෙන්නේ. ඒ ගැන ගරු ඇමතිතුමාගේ අවධානය මම යොමු කරවන්නට කැමතියි. මේ වාර්තාවට අදාළව නොවෙයි මම එය කියන්නේ. සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය ඉදිරියට ගෙන යන්නට ඕනෑ නම් බාටා සමාගමට අද දී තිබෙන නිදහස සීමා කළ යුතුව තිබෙනවා.

විවෘත ආර්ථික ප්‍රතිපත්තිය යටතේ සමහර කර්මාන්ත නිෂ්පාදනයන් අතින් තරඟ කරන්නට ගියාම ඒ කර්මාන්ත නැත්තටම නැතිවෙලා යනවා. අද ඒ තත්ත්වය ඇති වෙලා තිබෙනවා. මේ කර්මාන්තවල යෙදී සිටින මහත්වරු කීප දෙනක් මට කියා තිබෙනවා අද ඒ කර්මාන්තශාලා වසා දමන්නට සිද්ධ වෙලා ඉවරයි කියා. ගාල්ලේ දිසා ඇමතිතුමාගේ ආසනයේ තිබෙන බෙන්තොට 'ඉලාස්ටෝ' කම්හලේ සපත්තු නිෂ්පාදනය කළා. ඒ කර්මාන්තශාලාවේ අයිතිකරුවන් එම කර්මාන්තශාලාවට මෙහායින් මහජනතාවගේ යහපත සඳහා "ගුණසේකර අනුස්මරණ රෝහල" කියා ස්ප්‍රිතාලයක් පවා සාදවා දී තිබෙනවා. අද ඒ කර්මාන්තශාලාවත් වසා දමන්නට සිද්ධ වෙලා තිබෙනවා. 'මින්ස්', 'ඩීඑස්අයි', 'ඉලාස්ටෝ', 'සිත්වා' ආදී මේ සියලුම කර්මාන්තශාලා අද වසා දමන තත්ත්වයකට පත්වෙලා තිබෙනවා.

බාටා සමාගමෙන් තවත් වැඩක් කරනවා. පුංචි පුංචි කම්හල්වල නිෂ්පාදනය කරන සපත්තු අරගෙන ඒ අයගේ ලකුණ ගහලත් දැන් විකුණනවා. ලංකාවේ බාටා සපත්තු සමාගම මගින් දැන් සම්පූර්ණයන්ම ඒකාධිකාරයක් ලංකාවේ ඇති කරගෙන යනවා. මේ තත්ත්වය දිගින් දිගටම පවත්වාගෙන ගියොත් මේවායේ වැඩ කරන සේවකයන්ටත් ලංකාවේ හොඳ නිෂ්පාදනයක් ඇති කළ සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ නිෂ්පාදනවලටත් විශාල තරඟයක් ඇති වෙලා ඒවා වසා දමන්නට සිදුවන තත්ත්වයක් ඇති වන්නට පුළුවන්. එම නිසා මේ ගැන වහාම තීරණයක් ගන්නා ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිමින් මගේ වචන කිහිපය අවසන් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ 1982 වර්ෂයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් වී ඇති මේ අවස්ථාවේදී සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය ගැන වචන ස්වල්පයක් කථා කරන්නට ඕනෑ.

අක්මීමන ගරු මන්ත්‍රීතුමා (රිචඩ් පතිරණ මහතා) කීවාක් මෙන් මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය විවෘත ආර්ථිකයයි. මේ විවෘත ආර්ථිකය අනුව, ඕනෑම කෙනෙකුට ඕනෑම සපත්තු වර්ගයක් ලංකාවට ගෙන්වන්න පුළුවන්. [බාධා කිරීම්] යුරෝපයේ සහ ඇමරිකාවේ ප්‍රධාන සපත්තු සමාගම්වලින් නිෂ්පාදනය කරන ලද සපත්තු වර්ග අද ලංකාවට ගෙන්වනවා. [බාධා කිරීම්] ඒ සමහර සපත්තු වර්ග ලංකාවේදී බොහොම ඉහළ මිල ගණන්වලට විකුණනවා. [බාධා කිරීම්]

පර්සි සමරවීර මහතා
(திரு. பேஸி சமரவீர)
(Mr. Percy Samaraweera)

තමුන්නාන්සේ කථා කරන්නේ පිටරට සපත්තුවල මිල ගණන් දන්නේ නැතිවා වගෙයි.

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

මම නම් පිටරට සපත්තු අරගෙන නැහැ තමුන්නාන්සේ ගත්තාට.

පර්සි සමරවීර මහතා
(திரு. பேஸி சமரவீர)
(Mr. Percy Samaraweera)

තමුන්නාන්සේ හිතනවාද පිටරට සපත්තු ලාබයි කියලා මෙහි සපත්තුවලට වැඩියෙ ?

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

මම නම් දන්නේ නැහැ. මම කියන්නේ මෙයයි. ඒවා ගෙන්වන නිසයි මේ රටේ කර්මාන්තය පිරිහී තිබෙන්නේ. [බාධා කිරීම්] අපි ආණ්ඩු කරන කාලයේ පිටරටින් සපත්තු ගෙන්වූයේ නැහැ. අපේ ආණ්ඩුව කාලයේදී ලංකාවේ සපත්තු නිෂ්පාදනය වැඩි වුණා. අක්මීමන ගරු මන්ත්‍රීතුමා කීවාක් මෙන් 'ඩීඑස්අයි', 'සිත්වා' වැනි පොඩි පොඩි සපත්තු සමාගම් ලංකාවේ හුඟක් දියුණු වුණා. දැන් පිටරටින් සපත්තු ගෙන්වන නිසා මේ කර්මාන්ත ශාලාවල නිෂ්පාදනය අද නැති වෙලා තිබෙනවා. නියෝජ්‍ය ඇමතිතුමා දන්නවා නම් මේ කර්මාන්ත පහළට වැටිලා තිබෙන්නේ මොකද කියලා කියන්න.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

දැන් මිනිස්සු සපත්තු දන්නේ නැහැ.

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

සපත්තු ගන්න සල්ලි නැති නිසා. ඒකත් තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තියේ ප්‍රතිඵලයක්. මන්ද ? මධ්‍යම පන්තියේ උදවියට දැන් සල්ලි ටිකක් මදි. ඒ දවස්වල සපත්තු කුට්ටම් දෙකක් ගත්තා නම් එක කුට්ටමයි අද ගන්නට වෙලා තිබෙන්නේ. පිටරටවලින් භාණ්ඩ ගෙන්වීම නිසයි මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමා කී නිසා මම තවත් කාරණයක් පෙන්වා දෙන්නම්. 1980 වාර්තාවේ මෙහෙම තිබෙනවා.

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்னாண்டோ)
(Mr. N. Denzil Fernando)

1980 ?

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

ඔව්, ප්‍රශ්නයට පිළිතුරු දෙන්නයි මා මේ හදන්නේ.

I quote from the Annual Report of 1980 of the Ceylon Leather Products Corporation. At page 7, in paragraph 2, it states :

"The prospects for the market in Finished Leather were quite bleak with the influx of Chrome Tanned Leather from the Private Sector. Even a price reduction effected in November 1980 has not helped to improve the situation. The total sales of leather decreased dy Rs. 2.1 million when compared with the previous year. The ready availability of cheaper substitutes for real leather in the form, of P.V.C and P.U. sheets also contributed to a general drop in the demand for this product."

ඇත්තවශයෙන්ම එක පැත්තකින් පිටරටින් භාණ්ඩ මෙරටට ආවා. අනික් පැත්තෙන් මේ සංස්ථාව සමත් වුණේ නැහැ අලුත් වර්ගයේ අමුද්‍රව්‍ය පාවිච්චි කරන්න. ඇත්තවශයෙන්ම මේ හේතු නිසයි මේ සංස්ථාව මේ තරම් පහළ වැටුණේ. එහි සේවක සංඛ්‍යාව පහත වැටී තිබෙනවා. නමුත් අධ්‍යක්ෂ මණ්ඩලයට නම් අලුත් උදවිය ගන්න පුළුවන්. එවැනි තත්ත්වයක් අද ලංකා සම්භාණ්ඩ සංස්ථාවට ඇති වී තිබෙනවා. එම නිසා ගරු ඇමතිතුමා කියන්න ඕනෑ, මේ සංයුක්ත මණ්ඩලය අද වැටී තිබෙන තත්ත්වයෙන් දියුණු තත්ත්වයට පරිවර්තනය කරන්නේ කොහොමද කියල. එපමණයි මා මේ අවස්ථාවේදී කථා කරන්නේ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

මා දීර්ඝ වශයෙන් විවේචනය කරන්න යන්නේ නැහැ. විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා කිව්වා වාගේ අද විශේෂයෙන් දක්නට තිබෙන්නේ ඩී. එස්. අයි. සපත්තු. ඒ වාගේම ඩී. අයි. සපත්තු ආදියේ නිෂ්පාදනය අඩුවීම හා බාටා සපත්තුවල නිෂ්පාදනය වැඩිවීමයි. ඇත්තවශයෙන්ම අද සම් පදම් කිරීමේ සම්පූර්ණ කාර්යය බාටා කොම්පැනියට භාර දීම ආණ්ඩුවේ ප්‍රතිපත්තියක් හැටියට කෙරෙනවා. මෙම කොම්පැනිය පෞද්ගලික එකක්. මෙම බාටා කොම්පැනිය ලංකාවේ සම්පූර්ණ ආයෝජනයකින් කෙරෙන ආයතනයක් නොවේ. මෙය විදේශීය ආයෝජන එකතුවීමකින් කෙරෙන ආයතනයක්. නමුත් ඩී. එස්. අයි. වැනි ආයතන කරන්නේ මෙරට අය. ඒ ආයතනවලට කරන හානියක් වෙනවා, අර විධියට එය ආයතනයකට පමණක් විශේෂ සැලකිල්ලක් දක්වීම. සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ බලාපොරොත්තුව දේශීය කර්මාන්ත අඩපණ කරල විදේශිකයන් සමග සම්බන්ධකම් තිබෙන කර්මාන්තශාලාවලට විශේෂත්වයක් ලබා දීමයි. මේ ප්‍රතිපත්තිය වෙනස් කරන්න ඇමතිතුමා උත්සාහයක් ගන්නවාද ? එහෙම නැත්නම් විදේශිකයින්ට මීට වඩා මේ කර්මාන්ත අයත් කර දෙන්න කටයුතු කරනවාද ? ඒ දෙකෙන් එක තීරණයක් තමුන්නාන්සේ ගන්න ඕනෑ.

I quote from the 1982 Annual Report of the Ceylon Leather Products Corporation. At page 8, it states :

"10. prospects :

With the Government's policy to run Corporations profitably it is necessary to properly manage the oraganisations as well as keep up with modern technology. Since we are in a very competitive field, growth of the Corporation could only be achieved in new investment in machinery coupled with efficient management. In this context the assistsance received from UNIDO has proved very valuable. Further growth of the Corporation would be significant only on the completion of the modernization and expansion programme."

විදේශීය කර්මාන්ත ආයතන සමග සම්බන්ධ වී—සමහර විට ඒවාට හවුල් වී—කටයුතු කරන්නට මේ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස තිබෙනවාය කියන එක මෙයින් පැහැදිලි කරනවා. එහෙම කළොත්ලු, මේක දියුණු කරන්නට පුළුවන් වන්නේ. මෙතෙක් ස්වදේශීය කර්මාන්තයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආනන්ද දසනායක මහතා]

වශයෙන් හා ස්වදේශීය ආයතනයක් වශයෙන්—රජයේ ආයතනයක් වශයෙන්—යම්කිසි තත්ත්වයකට මෙය දියුණු කර තිබෙනවා නම් මේ අය ඒ ගැන කියන්නේ මොකක්ද ? දැන් තිබෙන අසාර්ථක තත්ත්වය ඇති වී තිබෙන්නේ විදේශීය ආයතන සමග තැත්නම් වෙනත් වෙළඳ ආයතනත් සමග සම්බන්ධ නොවීම නිසයි කියනවා. එහෙම නම් මම හිතන හැටියට ඒ අධ්‍යක්ෂ මණ්ඩලයේ බලාපොරොත්තුව ඉදිරියේදී මේවා විදේශීය ආයතනවලට පවරා දීමය කියන එකයි. මෙයින් අපට බලාපොරොත්තු වන්නට පුළුවන්කම තිබෙන්නේ.

විවෘත ආර්ථිකය අනුව ඕනෑම කෙනෙකුට සපත්තු ගෙන්වන්නට පුළුවන්. ඉම්පෝටස්ලා වශයෙන් ලියාපදිංචි වූ ඕනෑම වෙළෙන්දෙකුට සෑහෙන මුදලක් තිබෙනවා නම් සපත්තු ගෙන්වන්නට පුළුවන්. දැන් තිබෙන නොයෙක් සපත්තු සමහර විට මේ රටේ සිටින ඉතාම ධනපති පංතියේ කෙනෙකුට හැර පාවිච්චි කරන්නට බැහැ. දුප්පත් පංතියේ අයට හා සාමාන්‍ය මධ්‍යම පංතියේ අයට ප්‍රයෝජනයට ගන්නට පුළුවන් සපත්තු සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ කර්මාන්ත ශාලාවෙන් නිෂ්පාදනය වෙනවා නම් ඒ හොඳටම ඇති. නමුත් සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ සපත්තු කර්මාන්ත ශාලාව අඩපණ කර විදේශීය කර්මාන්තවලට කියනවා, " මේවා අපට නිෂ්පාදනය කරන්න බැහැ. විදේශීන්ට පමණයි, එය කරන්නට පුළුවන් " කියා. මෙයින් පෙනෙන්නේ මොකක්ද ? මේ රටේ දේශීය කර්මාන්ත හැම එකක්ම අඩපණ කරනවා.

මෙතන සිටින නිලධාරි මණ්ඩලයේ සුදුසුකම් බලන විට නම් ලංකාවේ පමණක් නොවෙයි, මුළු ලෝකයේම සපත්තු කර්මාන්තය දියුණු කරන්නට පුළුවන් දක්ෂ පුහුණු අය මෙහි සිටින බව පෙනෙනවා. නමුත් ඒ අයත් කියනවා " අපි අදක්ෂයි. අපි වෙනත් විදේශීය ආයතනයක් සමග සම්බන්ධ වන්නට ඕනෑ " කියා. මෙහි රහස මොකක්දැයි මම දන්නේ නැහැ. මේ තරම් සුදුසුකම් ලබා සිටින අය—highly qualified people—කියන්නේ එහෙමයි. ඒ අයගේ ටයිටල්ස් ගණනවත් ඒ සඳහා යොද තිබෙන අකුරු ගණනවත් මට කියවන්නට බැහැ, මේ පොතේ මේ පිටුවේ අන්තිම කෙළවර දක්වාම ලියැවී තිබෙනවා. ඒ තරම් ටයිටල්ස්—උපාධි—විදේශීය පුහුණුව ආදිය ඇති අය කියනවා. " අපි අදක්ෂයි. අපට විදේශීය මැනේජ්මන්ට් එකක් ඕනෑ " කියා. එනකොට මොකක්ද මෙහි තේරුම ? ඒ අය දක්ෂතා ලබා ඇත්තේ මොනවායින්ද ? ඒ අන්දමට විදේශිකයින් සමග සම්බන්ධකම් පවත්වනවාට වඩා නරකද ඒ අයගේ දක්ෂතාවය මේ රටට පෙන්වන එක ?

ඒ අයගේ උසස්කම මේ රටේ පමණක් නොවෙයි, විදේශීය වශයෙනුත් පිළිගන්නවා. එවැනි උපාධියි, ඒ අයට තිබෙන්නේ. මෙවැනි කර්මාන්ත ශාලාවක් ගෙන යන්නට නොවෙයි, මීට වඩා උසස් එකක් ගෙන යන්නට වුවත් හොඳ තත්ත්වයක ඒ අය සිටිනවා. එසේ තිබියදී ඒ අයට දේශීය වශයෙන් තමන්ගේ ස්වාධීන අදහස් යොමු කර ස්වාධීනව නැඟී සිටින්නට බැරි ඇයි ? මේ කර්මාන්ත ශාලාව දියුණු කර මුළු ලෝකයටම සපත්තු බෙදා දීමට කටයුතු කරන්නය කියා ඒ අයට උපදෙස් දෙන ලෙස මම ගරු ඇමතිතුමාට කියනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman of Committees)

The Hon. Minister can wind up now.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

I want to ask a question from him before he winds up, Sir. In his report at page 9, there is a trade debt of Rs. 5 million ; to be exact it is Rs. 4.959 million, and if you look at page 13, his trade variance or profit variance is 60 per cent. When the question was asked as to why this happened the reply given by the Chairman was that there had been a modernization programme taking place and thereby they could not look into the implementation progress. Now, Sir, this is a very serious matter which I want to bring to the notice of the Hon. Minister, because when a budget is prepared on the basis of implementing a scheme in a modernized way or perhaps where according to a programme you have to expand, then, we must see to one thing, and that is that the implementation of it is not delayed. Any delay in implementing any programme of modernization scheme means that you are going to spend a lot of money due to the delay. Now, what has happened to this factory as well as the business as a result o delaying the modernization programme ? I do not know why it got delayed. But, anyway, it was delayed and the report about the delay was given to the Ministry only in 1984, whereas it should have been given at leeast towards the end of 1982. Therefore, if you look into the budget and the actual figures you will find that there is a massive variance. The result is that this organisation is not doing well. That is one aspect of the matter.

The second is the submission made by the Opposition pertaining to the import of shoes, slippers –

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman of Committees)

Order, please ! The Deputy Speaker will now take the Chair.

අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [නෝමන් වෛද්‍යරත්න මහතා] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, குழுப் பிரதித் தலைவர் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [திரு. நோமன் வைத்யரத்ன] தலைமை வகித்தார்கள்.

Whereupon THE DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair and* MR. DEPUTY SPEAKER [MR. NORMAN WAIDYARATNA] *took the Chair.*

එකල්හි වේලාව අ. භා. 3.30 වුයෙන් කටයුතු අත්සිටුවා විවාදය කල් තබන ලදී.

එතැන් සිට විවාදය 1985 ජුනි 5 වන බදාද පවත්වනු ලැබේ.

அப்போது பி. ப.3.30 மணியாகிவிடவே அலுவல்கள் இடைநிறுத்தப்பட்டு, விவாதம் ஒத்திப்போடப்பட்டது.

விவாதம் 1985 ஜூன் 5, புதன்கிழமை மீளத் தொடங்கும்

It being 3.30 p.m., Business was interrupted, and the Debate stood adjourned.

Debate to be resumed on Wednesday, 5th June, 1985.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

I move,

"That the Parliament do now adjourn."

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா எடுத்தியம்பப்பெற்றது.

Question proposed.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ ප්‍රශ්න හැකි තරම් කෙටියෙන් ඉදිරිපත් කරන්නට මම බලාපොරොත්තු වෙනවා. මගේ පළමුවන ප්‍රශ්නය මම අහන්නේ ගරු කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ ඇමතිතුමාගෙන්. ඒ ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයට අදාළවයි.

(අ) ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයට අයත් ටැනරි අංශයේ ගොඩනංවන ලද ටැංකිය 1985.04.08 වැනි දින කඩා වැටී කේ. ඩී. රුබන්සිංඤෝ නමැති සේවක මහතකු මිය ගිය බව දන්නවාද ?

(ආ) මොහුට ඒ සඳහා වන්දියක් ගෙවා තිබේද ? එසේ නම් එහි වටිනාකම කොතෙක්ද ?

(ඇ) මොහුගේ අවමංගල්‍ය වෙනුවෙන් කොපමණ මුදලක් සංස්ථාව වැය කර තිබේද ?

(ඈ) මෙම ටැංකිය සෑදීම සඳහා ටෙන්ඩර් කැඳවන ලද්දේද ? එය ඉදිරිපත් කරන ලද්දේ කවුරුන් විසින්ද ?

මේ ප්‍රශ්නවලට එතුමාගෙන් පිළිතුරු මා බලාපොරොත්තු වෙනවා. මගේ දෙවන ප්‍රශ්නය අසා තිබෙන්නේ ගරු අග්‍රාමාත්‍යතුමාගෙන්. එයට පිළිතුරු අපේ ගරු පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ ඇමතිතුමාගෙන් ලැබෙනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. එම ප්‍රශ්නය මේකයි :

1985 මැයි මස 18 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ (අංක 349/35) මහජන ආරක්ෂක ආඥාපනත මගින් පත් කරන ලද ඒකාබද්ධ මෙහෙයුම් මණ්ඩලයේ සාමාජිකයන්ගේ නම් මෙම සභාවට ඉදිරිපත් කරනවාද ? එසේ නොවේ නම් ඒ මන්ද ?

මේ ප්‍රශ්නයටත් පිළිතුරු මම බලාපොරොත්තු වෙනවා.

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்னாண்டோ)
(Mr. N. Denzil Fernando)

The reply to the question addressed to me is as follows :

(*a*) Yes.

(*b*) Action is being taken to pay all compensation legally due to his dependants.

Compensation and death gratuity amounting to Rs. 12,708 together with any other payments ordered by the Commissioner, Workmen's Compensation.

(*c*) Approximately Rs. 6,000.

(*d*) Messrs. General Engineering Lanka, who were already doing construction work on a tender, were requested to give their quotation for the construction of this tank as it had to be done urgently. Thereafter this contruction work was given to this firm, and the total construction cost involved was Rs. 23,680.

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரோா)
(Mr. M. Vincent Perera)

The reply to the question addressed to the Hon. Prime Minister is as follows :

The Chairman of the Joint Operations Council is His Excellency the President as Commander in Chief of the Armed Forces.

The Council consists of the followisng members :

(1) Hon. R. Premadasa, Prime Minister.
(2) Hon. Lalith Athulathmudali, Minister of National Security.
(3) Mr. G. V. P. Samarasinghe, Secretary to the Cabinet and Addl. Secretary to the Ministry of Defence.
(4) Gen. D. S. Attygalle, Secretary, Ministry of Defence.
(5) Mr. D. B. I. P. S. Siriwardena, Secretary, Ministry of National Security.
(6) Lt. Gen. T. I. Weeratunga, General Officer Commanding, Joint Operations.
(7) Rear Admiral A. H. A. de Silva, Commander of the Navy.
(8) Maj. Gen. G. D. G. N. Seneviratne, Commander of the Army.
(9) Air Vice-Marshal A. W. Fernando, Commander of the Air Force.
(10) Mr. H. W. H. Weerasinghe, Inspector-Genral of Police.
(11) Mr. L. D. C. Herath, Director-General of Intelligence and Security.
(12) Mr. Ravi Jayewardene, Security Adviser to the President, and
(13) Mr. Merryl Guneratne, Director, National Intelligence Bureau.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 3.32 ට, 1985 ජූනි 5 වන බදාදා පූ. භා. 10 වන තෙක් කල් ගියේ ය.

அதன்படி, பி. ப. 3.32 மணிக்கு பாராளுமன்றம், 1985 ஜூன் 5 புதன்கிழமை மு. ப. 10.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Adjourned accordingly at 3.32 p.m. until 10 a.m. on Wednesday, 5th June 1985.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
வினுக்களுக்கு எழுத்துமூல விடைகள்
WRITTEN ANSWERS TO QUESTIONS

පී. කේ. සරනේලිස් අප්පුහාමි මහතා : වන්දි
திரு. பீ. கே. சரனேலிஸ் அப்புஹாமி : நட்டஈடு
MR. P. K. SARENELIS APPUHAMY : COMPENSATION

212/85

1. ආචාර්ය ඩබ්ලිව් දහනායක මහතා (ගාල්ල)
(கலாநிதி டபிள்யு. தஹநாயக்க — காலி)
(Dr. W. Dahanayake-Galle)

ප්‍රවාහන කටයුතු පිළිබඳ ඇමතිතුමා සහ ගමනා ගමන මණ්ඩල ඇමතිතුමා සහ පුද්ගලික බස් ප්‍රවාහනය පිළිබඳ ඇමතිතුමා සහ වාණිජ සහ කර්මාන්ත ආයතනයන්ගේ ආරක්ෂාව පිළිබඳ ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) ගාල්ලේ බටගන්විල අංක 37 පදිංචි පී. කේ. සරනේලිස් අප්පුහාමි මහතා 1984 පෙබරවාරි 20 වැනි දින ප. ව. 11.30 ට පමණ රිච්මන්ඩ් හිල් දුම්රිය ස්ථානයේදී දුම්රියෙන් බසින විට බරපතල තුවාල ලැබූ බවත් 1984 මැයි 18 වැනි දින ගරු ඇමතිතුමාට එවූ ලිපියකින් හා ඊට පසුව එවන ලද ලිපි මගින් ඔහු වන්දි මුදල් ඉල්ලා සිටි බවත් එතුමා දන්නේද ?

(ආ) එතුමා සරනේලිස් අප්පුහාමි මහතාට සුදුසු වන්දි මුදලක් ප්‍රදානය කරන්නේද ?

(ඇ) නොකරන්නේ නම්, ඒ මන්ද ?

போக்குவரத்து அமைச்சரும் போக்குவரத்துச் சபைகள் அமைச்சரும் தனியார் பஸ் போக்குவரத்து அமைச்சரும், வர்த்தக, கைத்தொழில் நிறுவனங்கள் பாதுகாப்பு அமைச்சரும் ஆனவரைக் கேட்ட வினு :

(அ) 37, பட்டகன்விலே, காலி என்ற முகவரியிலுள்ள பி. கே. சரனேலிஸ் அப்புகாமி என்பவர் 1984 பெப்ருவரி 20 இரவு 11.30 மணியளவில் றிச்மண்ட் ஹில் ரெயிலிலிருந்து இறங்கும்போது படுகாயம் அடைந்தார் என்பதையும் 1984 மே 18 ஆந் தேதியிட்டு கௌரவ அமைச்சருக்கு அனுப்பிய கடிதம் மூலமும் அதையடுத்த பல தொடர்புகள் மூலமும் அவர் நட்ட ஈடு கோரினுர் என்பதையும் அவர் அறிவாரா ?

(ஆ) திரு. சரனேலிஸ் அப்புஹாமிக்கு அவர் தகுந்த நட்ட ஈடு வழங்குவாரா ?

(இ) இல்லேயேல், ஏன் ?

asked the Minister of Transport, and Minister for Transport Boards and Minister for Private Ominibus Transport and Minister for Security of Commercial and Industrial Establishments :

(*a*) Is he aware that Mr. P. K. Sarenelis Appuhamy of 37, Bataganwila, Galle, suffered serious injury on 20th February, 1984, when getting down from the train at about 11.30 p.m. at the Richmond Hill Rilway Station, and that he claimed compensation in a letter addressed to the Hon. Minister dated 18th May, 1984, and in several subsequent communications ?

(*b*) Will he award suitable compensation to Mr. Sarenelis Appuhamy ?

(*c*) If not, why ?

එම්. එච්. මොහමඩ් මහතා (ප්‍රවාහන ඇමතිතුමා, ගමනාගමන මණ්ඩල ඇමතිතුමා, පුද්ගලික බස් ප්‍රවාහන ඇමතිතුමා සහ වාණිජ හා කර්මාන්ත ආයතන ආරක්ෂක ඇමතිතුමා)

(ஜனுப் எம். எச். முஹம்மத் — போக்குவரத்து அமைச்சரும் போக்குவரத்துச் சபைகள் அமைச்சரும் தனியார் பஸ் போக்குவரத்து அமைச்சரும் வர்த்தக, கைத்தொழில் நிறுவனங்கள் பாதுகாப்பு அமைச்சரும்)

(Mr. M. H. Mohamed - Minister of Transport, Minister for Transport Boards and Minister for Private Omnibus Transport and Minister for Secutiry of Commercial and Industrial Establishments)

(අ) පී. කේ. සරනේලිස් මහතා 1984. 02. 20 දින රිච්මන්ඩ් හිල් දුම්රිය ස්ථානයෙන් දුම්රියෙන් බසින විට වැටී තුවාල ලබා ඇති අතර ඒ සඳහා වන්දි ඉල්ලා තිබේ.

(ආ) සරනේලිස් මහතාට වන්දි මුදල් ගෙවීම ගැන සලකා බැලීම සඳහා පරීක්ෂණ පවත්වාගෙන යන අතර, එම අතතුර සම්බන්ධයෙන් ඔහුගෙන් වෛද්‍ය වාර්තාවක් ඉල්ලා ඇත. එකී වෛද්‍ය වාර්තාව ලද පසු වන්දි ගෙවීම පිළිබඳව තීරණයක් ගනු ලැබේ.

(ඇ) ඉහත " ආ " අනුව පැන නොනගී.

(*a*) Mr. P. K. Sarenelis has claimed compensation for the injuries he sustained when detraining at Richmond Hill Station on 20.02.1984.

(*b*) Investigations are being carried out regarding payment of compensation to Mr. Sarenelis and a medical report has been called for from him. A decision for payment of compensation will be taken after the receipt of the medical report.

(*c*) Does not arise (vide "*b*" above)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සැ. යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මීන් පිටපතක් ගෙන එහි ඒවා පැහැදිලිව දක්වා එම පිටපත හැන්සාඩ් සංස්කාරක වෙත

1985 ජූනි 18 වන අඟහරුවාද

තොඉක්මවා ලැබෙනසේ එවිය යුතුයි.

குறிப்பு

அங்கத்தவர்கள் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை அறிக்கையிற்றெளிவாகக் குறித்து பிழை திருத்தங்களைக் கொண்ட பிரதியை ஹன்சாட் பதிப்பாசிரியருக்கு

1985 ஜூன் 18, செவ்வாய்க்கிழமைக்குப் பிந்தாமற்

கிடைக்கக்கூடியதாக அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print should be clearly marked in this Report and the *copy containing the corrections must reach* the Editor of HANSARD,

not later than

Tuesday, 18th June 1985

Contents of Proceedings	:	**From 10.00 a.m. to 3.32 p.m. on 04.06.1985**
Final set of manuscripts received from Parliament	:	**7.15 p.m. on 04.06.1985**
Printed copies despatched	:	**05.06.1985 morning**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 200/- කි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 175/- කි). පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 2.50 කි. තැපැල් ගාස්තුව ශත 90 කි. කොළඹ 1, තැ. පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබාගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

சந்தா : ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 200/- (திருத்தப்படாத பிரதிகள் ரூபா 175/-) ஹன்சாட் தனிப்பிரதி ரூபா 2·50. தபாற் செலவு 90 சதம். வருடாந்த சந்தா முற்பணமாக அத்தியட்சர், அரசாங்க வெளியீட்டலுவலகம், த. பெ. இல. 500, கொழும்பு 1 என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவெம்பர் 30 ந் தேதிக்குமுன் சந்தாப் பணம் அனுப்பப்படவேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

Subscriptions : The annual subscription for Official Report of Hansard is Rs. 200/- (For uncorrected copies Rs. 175/-). A single copy of Hansard is available for Rs. 2.50. (Postage 90 cts.) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box, 500 Colombo 1. The fee should reach him on or before November 30 each year. Late applications for subscription will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org